# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,926 — 1970 ඔක්තෝබර් 2 වැනි සිකුරාද — 1970.10.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1399 | කොටුපල් වෙ‍ෙන්ද හා වෙනත් වෙ‍ෙන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1420 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1421 | රට කීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1428 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1429 | විවිධ දැන්වීම ... ... ... ... | 1432 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය, වාර්ෂිකව රු. 7,800ක ආරම්භක වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) විශ්ව විද්‍යාලයක හෝ සම මට්ටමක අවුරුදු 3ක ඉගැන්වීමේ පළපුරුද්ද හා උපාධියක් ඇති ආධුනිකයින් භාණ්ඩාගාර යේ අනුමැතිය ඇතිව රු. 7,800 වැටුප් තලයේ තැබීමට ඉඩ ඇත. රජයේ සේවයේ දැනටමත් නියුතු වූවකු තෝරාගනු ලැබුවහොත් 1959.6.13 දින දරණ අංක 492 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද 1957.2.26 දින දරණ අංක 361 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ කොන්දේසි අනුව ඔහුගේ පඩිය තීරණය කෙරෙනවා ඇත.

(iii) **ඒ.එම්.අයි.සී.ඊ., ඒ.එම්.අයි.ඊ.ඊ. හෝ ඒ. එම්. අයි.** යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම්, ඔවුනට ද වර්ෂයකට රු. 9,960ක ආරම්භක වැටුපක් හිමිවේ..

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධිලත්, II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය වරුන් ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 11,040ක වැටුප් පියවරට පැමිණ එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුහු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව, අවුරුද්දකට රු. 13,440ක වැටුප් පියවර දක්වා වැටුප් හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.10.16 වැනිදා තමන්ගේ වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) යාන්ත්‍රික ඉංජිනේරු විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියෙන් හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම ; හෝ

(ii) යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ ආයතනයේ "ඒ" සහ "බී" කොටස් වලින් සාමාර්ථය ලබා තිබීම සහ කර්මාන්ත ශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 3ක පළපුරුද්දක් ලබා තිබීම ; හෝ

(iii) පිළිගත් කාර්මික ආයතනයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යා පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ඇතුළුව කර්මාන්ත ශාලාවක යටත් පිරිසෙයින් අවුරුදු 3ක පළපුරුද්දක් ලබා තිබීම, සහ

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට පුළුවන්වීම හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත දී සිංහල භාෂාවේ ප්‍රවීනත්වයක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින්ම තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේනමුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

10–183/1—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 32/එක්ස් 2279/70.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ නිලධාරි තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ නිලධාරි තනතුර සඳහා **ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු** ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි **ඉල්ලුම් පත්** පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට, අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නො වූද තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නො ගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) **ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී** නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස, විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැ යි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයන් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත් කරන ලද නම් ඇයට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභයක් හිමිවනු ඇත. ඇය විසින් තමාගේ වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. නිලධාරිනියක අවුරුදු 10 ක සේවය සම්පූර්ණ කිරීමට පෙරාතුව විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීම හෝ අර්ථ සාධක අරමුදලට තවදුරටත් දායකවීම හෝ සඳහා සිය මනාපය ඇය විසින් පළකල යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරියක ලෙස හෝ අර්ථ සාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනටමත් අවුරුදු 10 ක සේවය කර ඇත් නම් මෙම පත්වීම ලැබ මාස 6 ක් ඇතුළත ඇයගේ මනාපය පළකල යුතු යි.

(ii) පත්වීම පළමු වරට අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු පළමු වරට එක් අවුරුදු වැඩ බැලීමකට යටත්ව පත් කරනු ලැබේ.

(iii) තෝරාගනු ලැබූ අයදුම්කරු, පත්වීම ලැබූ දින සිට තුන් අවුරුදු කාල සීමාවක් තුළ දී, රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා හා පාලන රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ඇයි ප්‍රශ්න පත්‍ර තුනකින් යුතු රාජ්‍ය ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ විභාගයකින් සාමාර්ථය ලැබිය යුතුය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩ දී ඇති කාලසීමාවට වැඩි කාලයක් ගත වී සාමාර්ථය ලැබූ විට එසේ ගතවූ වැඩි කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්භනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ඇත.

(iv) තෝරාගනු ලැබූ අයදුම්කරු පත්වීම ලැබූ දින සිට සතර අවුරුදු කාලසීමාවක් ඇතුළත දී සාමාන්‍ය ලිපිකාර සේවාවේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත සිංහල/දෙමළ ජාතික භාෂා විභාගයේ දී තමාට උචිත පරිදි සිංහල/ දෙමළ භාෂාවෙන් සාමාර්ථය ලැබිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් වැටුප් වැඩිවීම විලම්බනය කිරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩ දී ඇති කාලසීමාවට වැඩි කාලයක් ගත වී සාමාර්ථය ලැබූ විට එසේ ගත වූ වැඩි කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—වාර්ෂිකව රු. 11,040 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 480 ක වැටුප් වැඩිවීම් 11 කින් යුක්තව ද, රු. 14,880 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇතිව රු. 16,320 දක්වා වූ ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ii) 1970 ඔක්තෝබර් මස 16 වැනි දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි ;

(iii) (අ) පිළිගත් වෘත්තීය ඉංජිනේරු ගණයක ඒකාබද්ධ සාමාජිකත්වය තිබීම ;

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයකු වීම ;

හෝ

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක ඉංජිනේරු තනතුරක් දරණ නිලධාරියෙකු වීම (වෘත්තීය සුදුසුකම් නො මැති වුවද, ඒ ඒ දෙපාර්තමේන්තුවට අදාල අනුමත බඳවාගැනීමේ පරිපාටියකට අනුකූලව ඉංජිනේරුවෙකු වශයෙන් උසස් කරණු ලැබුවන්ගෙන් ඉල්ලීම් සලකා බලනවා ඇත.) ;

හෝ

(ඈ) කාර්මික විෂයයන් සම්බන්ධ ජ්‍යෙෂ්ඨ හෝ උඩෘත ශ්‍රේණියේ උපදේශකවරුන් වර්ෂයකට රු. 7,400 වැටුපට නො අඩු වැටුපක් ලබන්නේ නම් ;

හෝ

(ඉ) පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධියක් ඇති කණිෂ්ඨ කාර්මික ආයතනයක විදුහල්පති වරයෙකු වීම ;

(i) (අ) ඉහත (iii) (අ) සුදුසුකම් ලද්දවුන් 5 අවුරුද්දක ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් තිබීම;

හෝ

(ආ) ඉහත (iii) (ආ) (ඇ) (ඈ) හෝ (ඉ) සුදුසුකම් ලද්දවුන් 10 අවුරුද්දක ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පලපුරුද්දක් තිබීම. ;

(v) සිංහලෙන් ඉගැන්වීමට හැකියාව තිබිය යුතුය. නැතහොත් අවුරුදු 3 ක් ඇතුළත සිංහල ප්‍රවීණතාවය ලබාගත යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැ යි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් ෆෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර ෆෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැ. පෙ. 500.

**10-183/2—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය**

අංකය : ඒ 88/එක්ස්. 2280/69.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යාලේඛනඥ තනතුර

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනඥ තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත්, පහත සඳහන් දිනට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1970 ඔක්තෝබර් මස 16 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1970 ඔක්තෝබර් මස 23 වැනිද.

**සටහන්—**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු, රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් "9×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දාවූ ද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශීයයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවෙන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි, දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුරට පත් කරනු ලබන පිරිමි අපේක්ෂකයින් පත් කිරීමේ දින සිට තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වනු ඇත. පත් කරනු ලබන අපේක්ෂිකාවන් පළමුවෙන් අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ පත් කරනු ඇත. ඔවුන් පත්වීමේ දින සිට අවුරුදු තුනක පරීක්ෂණ කාලසීමාවකට යටත්වනු ඇත. එම අපේක්ෂිකාවන්ට අවුරුදු දහයක සේවය සම්පූර්ණ කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී විශ්‍රාම වැටුප් ලබන තත්ත්වයට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකිය. එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව නැවත එය අවලංගු කළ හැකි නොවේ.

දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් දරන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහු නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත් කරනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—වර්ෂයකට රු. 6,720 න් පටන් ගෙන රු. 360 බැගින් වාර්ෂික වැඩිවීම් 12 ක් හා රු. 480 බැගින් වාර්ෂික වැඩිවීම් 11 ක් ද සහිතව රු. 16,320 දක්වා නගී. මේ වැටුප් ක්‍රමයේ රු. 11,520 හා රු. 14,880 යන වාර්ෂික වැටුප් පියවරවලට පෙර කාර්යක්ෂමතා කඩඉම්ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.10.16 වැනිදා තමන්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (i) සංඛ්‍යානි, ගණිතය, ආර්ථික විද්‍යාව, ප්‍රජාවිද්‍යාව, සමාජ විද්‍යාව, හෝ මානව විද්‍යාව යන එක් විෂයයකින්, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ පළමුවෙනි හෝ දෙවැනි පංතියේ විශේෂ උපාධියක් හෝ පශ්චාත් උපාධියක්, හෝ

(ii) ගණිතය විෂයයක් වශයෙන්, පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවැනි පංතියේ සාමාන්‍ය උපාධියක්,

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ල අවශ්‍යවූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය, (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය,

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැළකිය යුතුය —**

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉලලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියාඑවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන් ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

10–183/3—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ඒබී. 44/එක්ස්. 2281/70.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී තනතුර

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1970 ඔක්තෝබර් මස 16 වැනිදා.

(බී) පිටරට ඉල්ලුම් පත්‍ර : 1970 ඔක්තෝබර් මස 23 වැනිදා.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතා පැහැදිළිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූවද, තම ලිපිනය ලියන ලද්දවූ ද, මුද්දර නොගැසුවාවූ ද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන්හි තිබෙන ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්‍ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්. ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක විය යුතුය. ඔහුගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. වර්‍ෂයකට රු. 6,720—12 × 360—රු. 11,040 ක් වේ.

**සටහන :** විශ්‍රාම වැටුප් සහිත සථිර තනතුරක් දරණ රජයේ සේවක යෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු පළමුවෙන් අළුත් තනතුරෙහි අවුරුදු දෙකක් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970 ඔක්තෝබර් මස 16 වැනි දිනට ඔහුට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ පරිපාලනීය ගණකාධිකරණය, ගබඩා කටයුතු සහ පුස්තකාලයාධිපති වරයෙකු වශයෙන් පුස්තකාල පාලනය පිළිබඳ අවුරුදු 5කට නොඅඩු පළපුරුද්දක් තිබීම, සිංහල පිළිබඳ විශිෂ්ඨ දැනීමක් තිබිය යුතුය.

(ඈ) පරිපාලනය, ගණකාධිකරණය, ගබඩා කටයුතු සහ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් පුස්තකාල පාලනය පිළිබඳ අවුරුදු 5 කට නොඅඩු, පළපුරුද්දක් සහ සිංහල පිළිබඳ විශිෂ්ඨ දැනීමක් තිබේ නම් වයස් සීමාව සහ අධ්‍යාපනික සුදුසුකම් ගැන නොසලකා පහත සඳහන් අයවළුන්ගෙන්ද අයදුම්පත් භාරගනු ලැබේ.

(i) සාමාන්‍ය ලිපිකරු සේවයේ හෝ ඒ හා සමාන සේවයක විධායක ලිපිකරු පන්තියේ I වැනි ශ්‍රේණියේ හෝ උසස් ශ්‍රේණියක නිලධාරීන්ගෙන්, සහ

(ii) රජයේ ප්‍රකාශන කාර්යාංශයේ සහකාර අධිකාරී තනතුර දරන්නාගෙන්.

**සටහන :** දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමට හැකියාවක් තිබීම අතිරේක සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික හෝ භාරගනු නොලැබේ).

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතික,

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යයන අධ්‍යක්‍ෂතැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය,

(ඈ) වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතික,

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. : (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්‍ෂකයින්ගේ අයදුම් පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමතමන්ට නිකුත් කරන ලද ("ඒ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණකොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නා වූද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

10–183/4—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ඒබී. 96/එක්ස්. 2283/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්ද වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවනට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශ යන්හී සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවර යෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) තෝරා ගනු ලැබූ අයදුම්කරු හට මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය කටයුතු ගැන පුහුණුවක් ලබා දෙනු වස් ශිෂ්‍යත්වයක් යටතේ පිටරට යැවීමට ඉඩ ඇත.

3. **වැටුප් සහ දීමනා**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :—

වර්ෂයකට රු. 6,720—360න් 12 සහ 480න් 11—රු. 16,320කි. තෝරාගනු ලැබූ අයදුම්කරුට මෙම වැටුප් ක්‍රමය යටතේ වර්ෂයකට රු. 11,040 ඉක්මවා යාමට පිළිගත් විශ්ව විද්‍යාලයකින් මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගත යුතුය.

සැ. යු.—ඩිප්ලෝමා උපාධි දරන්නන් සම්බන්ධයෙන් නම්, ඉහත සඳහන් වැටුප් ක්‍රමය අදාල වනුයේ 54. 4. 1 වැනි දිනට පෙර සේවයට බැඳුන ගොවිකම් දෙපාර්තමේන්තුවේ සහකාර පශු වෛද්‍ය නිලධාරීන්ට පමණයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970. 10. 16 වැනි දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 45ට නොවැඩි බව (මෙම උපරිම වයස් සීමාව දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි බලපාන්නේ නැත.)

(ඇ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් හෝ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති බව; හෝ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා, පශු වෛද්‍ය නිලධාරියකු වශයෙන් අඩු ගණනේ අවුරුදු පහක වත් පළපුරුද්දක් ඇති බව;

(iii) මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය අංශයට අදාළ එළිමහන් කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වන්නේ ය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතු ය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතු ය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්ත මේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනිදා,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

10–183/6—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

අංකය : ඒබී. 94/එක්ස්. 2284/70.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ තනතුර—I ශ්‍රේණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ තනතුර 1 ශ්‍රේණිය සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1970 ඔක්තෝබර් මස 23 වැනිදා.

**සටහන :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දවූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර ෆෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන් ගේ කාර්‍යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්‍යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම පළමුවෙන් ම දෙනු ලබන්නේ අවුරුදු තුනක ආධුනික කාලයක් මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

**ඒකාබද්ධ වැටුප.**—අවුරුද්දකට රුපියල් 17,040 කින් පටන්ගෙන රුපියල් 600 වාර්ෂික වැඩිවීම් 3 ක් මගින් රුපියල් 18,840 දක්වා වැඩිවී යයි. (1969.10.1 දිනට පෙර අනුරූප මූලික වැටුප රු. 13,800—3×600—15,600).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1970.10.16 වැනි දිනට අවුරුදු 35 ට නොඅඩු බව සහ අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(සී) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ බී. එස්. සී. උපාධියක් හෝ බී. ඒ. හෝ බී. එස්. සී. (ආර්ථික විද්‍යාව) උපාධිය හෝ බී. එස්. සී. කෘෂිකර්ම ආර්ථික විද්‍යාව උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම්,

සහ

(ආ) කෘෂිකර්ම ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත පශ්චාත් උපාධියක් සහ උපාධිය ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධියක් උසුලන වෙළඳ ආයතනයක අවුරුදු 10 ක පළපුරුද්දක් හෝ කෘෂිකර්ම ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලැබීමෙන් පසු අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති බව.

**සටහන.**—නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් නොමැති වුවහොත් අඩු පළපුරුද්දක් ඇති අයෙකු අයදුම්කරුවන් අතරින් තෝරාගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. සැ.යු.— අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. **රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්** විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවියයුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු **ලැබේ.**

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර ෆෝරමය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්‍යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම් කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මග ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
තැ. පෙ. 500,

10–183/7—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

අංකය : ඒබී. 57/එක්ස්. 2285/70.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### රෝහල්හි II වැනි ශ්‍රේණියේ වෛද්‍ය අධිකාරි තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල්හි II වැනි ශ්‍රේණියේ වෛද්‍ය අධිකාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 ඔක්තෝබර් මස 16 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 ඔක්තෝබර් මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවේයි.

2. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නො ලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරු පත්වීම ස්ථිර කිරීමට පෙර පාලන රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා ආරෝග්‍යශාලා පාලනය හා සිංහල/දෙමළ භාෂාව පිළිබඳ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම පරීක්ෂණය නම් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සඳහා පැවැත්වෙන පරීක්ෂණයයි.

මෙම පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වුවහොත් 120, 121 යන පාලන රෙගුලාසි වලට විධිවිධානයන් අදාළ වනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය. රු. 11,520 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතව, වර්ෂයකට රු. 9,600—360 × 4 හා 480 × 7—රු. 14,400 කි. වර්ෂයකට රු. 11,520 ට පෙර කාර්යක්ෂමතා කඩඉම වැඩ සහ හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දෙනු ලබන සහතිකයකින් සමන්විතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970 ඔක්තෝබර් මස 16 දිනට අවුරුදු 33 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන් කෙරේ බලපාන්නේ නැත.)

(සී) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ඇති බව.

(ඩී) රජයේ ආයුර්වේද ආරෝග්‍යශාලාවක වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නො අඩු පළපුරුද්දක් ඇති බව,

හෝ

සාමාන්‍ය ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් අවුරුදු 15 කට නො අඩු පළපුරුද්ද ඇති බව,

(ඊ) පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශණ පළ කිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තිය ඇතිබව.

**සටහන.**—පරිපාලන පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (**සැ. යු.**—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල් වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේවුවද වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

10-183/8—70.10.2 දින අංක 14,926 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෘත්තීය චිකිත්සක තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෘත්තීය චිකිත්සකයින් හැටියට පත් කරනු පිණිස සුදුසුකම් ලත් (ගැහැණු පිරිමි දෙපසෙහි) වෘත්තීය චිකිත්සකයින්ගෙන් ඇයැදුම් පත් කැඳවනු ලැබේ. මෙහි මතු දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුකරණයෙන් පිළියෙල කළ යුතු ඇයැදුම් පත්, 1970.10.23 වනදා හෝ ඊට පෙර හෝ මා වෙත ලැබිය යුතු යැ.

2. මේ තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය අවුරුද්දකට රු. 3,864—144 × 18—රු. 6,456 ක් වේ. අවුරුද්දකට රු. 5,064 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙක් වේ.

3. **තිබිය යුතු සුදුසුකම්.**—සෑම අපෙක්ෂක-අපෙක්ෂිකාවක් විසින් මැ—

(අ) 1970.10.23 වනදට තම වයස අවුරුදු 21 ට නො අඩු 40 ට නො වැඩි බවටත්,

(ආ) විශිෂ්ට චරිතයෙකිනුත් මනා කායික සෞඛ්‍යයෙනුත් තමා යුක්ත බවටත්,

(ඉ) පිළිගත් අභ්‍යාස මධ්‍යස්ථානයකින් වෘත්තීය චිකිත්සාව විෂයයෙහි ඩිප්ලෝමා සහ්තස ලබා සිටින බවටත්,

පිළිගැණෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු යැ.

4. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති—**

(i) පත්වීම් ලබන පිරිමි අය විෂයයෙහි මේ තනතුරු විශ්‍රාම වැටුප් හිමි සථිර තනතුරු වන අතර, වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අය කරනු ද ලැබේ. පත්වීම් ලබන ගැහැණු අයගෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබීමට ඔවුන් නිස්සත් වනුයේ 57.4.29 දිනැති අංක 372 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ලෙසිනි.

(ii) තෝරා ගනු ලබන අපෙක්ෂක-අපෙක්ෂිකාවන්ට, දනුම් දී කෙටි කාලයක් ඇතුළත රාජකාරි බාර ගන්නා ලෙස නියම කරනු ඇත.

5. ඇයැදුම්කරුවන් තම ඇයැදුම් පත සමග මෙහි කියැවෙන ලියකියවිලිවලැ (මුල් ලියකියවිලි නොවේ) පිටපත් ද අමුණා එවියැ යුතු යැ :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය (සැ.යු.—බවුතිස්ම සහතිකයවත්, උපකෘත පාසල්හි රීති යටතේ නිකුත් කැරෙන ලුහුඬු උප්පැන්නවත් මේ සඳහා පිළිගනු නො ලැබේ).

(ආ) ලබා ඇති වෘත්තීය චිකිත්සාව විෂයයෙහි ඩිප්ලෝමා සහතිකය.

(ඉ) මේ තනතුර දැරීමට ඇයැදුම්කරුගේ සුදුසුකම්, චරිතය, යෝග්‍යතාවය දක්වෙන පරිදි ළඟ දී ලබාගත් චරිත සහතික තුනක් (දනට මැත් රාජ සේවයේ නියුක්ත අපෙක්ෂක-අපෙක්ෂිකා, මේ උප වගන්තිය යටතේ චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය යි).

6. ඇයැදුම් පත් ද, ඒ හා සම්බන්ධ වෙනත් ලියුම් කියුම් ද එවියැ යුත්තේ කොළඹ, තැ. පෙ. අංක 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ලිපිනය ලියා මිසැ, මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුට නමින් අමතා නොවේ.

7. මේ ගැසට් පත්‍රයේ I වන කොටස (II) ඡේදය පටන් ගැන්මේ දී පළ වී ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට දෙන පත් කිරීම් සම්බන්ධයෙන් බලපවත්නා පොදු කොන්දේසි ද කියවා බලනු වටි.

සී. එස්. එච්. පී. ජයසූරිය,
වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක.

1970. 10. 2 වනදා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

### එකී ඇයැදුම්පතේ ආකෘතිය

#### වෘත්තීය චිකිත්සක තනතුරට ඇයැදුම් පත

1. (අ) මුළු නම :————.

(ආ) ලිපිනය :————.

2. (අ) 1970.10.23 වනදට හරි වයස :—

අවුරුදු :—— යි, මාස :—— යි, දින :—— යි.

(ආ) උපන් දිනය සහ තැන (උප්පැන්නයේ පිටපතක් අමුණා එවිය යුතු යි) :————.

3. ජාතිය :————.

4. විවාහක ද, තනිකඩ ද, කනවැන්දුම් ද යන වග :————.

5. දරුවන් ඇත්නම් ඔවුන්ගේ ගණන සහ වයස :————.

6. වෘත්තීය චිකිත්සාව විෂයයෙහි ඩිප්ලෝමාව ලබා තිබේද යන වග :————.

7. පාසලෙන් අස්වූ තැන් පටන් කළ රැකියාව :————.

8. විශේෂ හිමිකම්, සුදුසුකම්, පළපුරුදුකම් කිසිවත් වෙතොත් ඒ පිළිබඳ වගතුග :————.

9. චරිත සහතික දුන් (නෑසිත් නොවන) අයවලුන්ගේ නම් සහ පදවි :————.

10. වෙනත් තොරතුරු කිසිවක් වෙතොත් එය :————.

————,
අස්සන.

දිනය :————.

10–39—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/3/114

## අධ්‍යාපන අමාත්‍යාංශය

### යුගෝස්ලෝවියානු පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව—1971

යුගෝස්ලෝවියානු රජය විසින් පශ්චාත් උපාධි මට්ටමේ කාර්මික අධ්‍යයනය සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව උදෙසා පහත සඳහන් ක්ෂෙත්‍රයන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

ඉංජිනේරු විද්‍යාව

වාස්තු විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අවුරුදු දෙකක් වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ යුගෝස්ලෝවියානු රජයේ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුය :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ii) 1970.10.15 වැනි දිනට, වයස අවුරුදු 25 ට අඩු විය යුතුයි.
(iii) ඉංගිරිසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණතාවයක් තිබිය යුතුයි.
(iv) යටත් පිරිසෙයින්, අනුගමනය කිරීමට අදහස් කරන පාඨමාලාවට අදාල විෂයයන්ගෙන් ලබා ගත් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ආර්. අයි. බී. ඒ. අන්තර් මධ්‍ය සහතිකයක් හෝ ලබා තිබිය යුතුයි.

**සංලක්‍ෂය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.10.15 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත් නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(i) නවාතැන් පහසුකම් හා අනිකුත් පෞද්ගලික වියදම් සඳහා මාසික දීමනාවක්,

(ii) යුගෝස්ලෝවියාවට ගිය විට ගෙවනු ලබන ඇඳුම් දීමනාවක්,

(iii) සෑම නව අධ්‍යයන වසරක් පාසා පොත් මිළ දී ගැනීම පිණිස ගෙවනු ලබන දීමනාවක්,

(iv) අධ්‍යයන පාඨමාලාවට ඩිප්ලෝමා විභාගයක් අයත් වන්නේ නම්, ඊට සූදානම් වීම පිණිස දීමනාවක්,

(v) අධ්‍යයන පාඨමාලාව සඳහා නිවාඩු කාලය තුළ ප්‍රායෝගික වැඩ කළ යුතු වන්නේ නම් ඒ සඳහා යන වියදම ආපසු ගෙවීම,

(vi) යුගෝස්ලෝවියානු පුරවැසියන්ට වලංගු වන තත්ත්වයේ සනීපාරක්‍ෂාව ලබා දීම,

(vii) ඉගෙනීමේ සාර්ථකත්වය අනුව, ගෙවනු ලබන දීමනාව සෑම අධ්‍යයන වසරක් අන්තයේ දී නිශ්චිත ප්‍රමාණයකින් වැඩි කිරීම හෝ අඩු කිරීම,

**සංලක්‍ෂය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් යුගෝස්ලෝවියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් යුගෝස්ලෝවියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්‍ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්‍ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්‍ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැන්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970.10.10 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු ය. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් තම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් අයදුම් කළ යුතුය.

17. සියලුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

10–154—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර (තාවකාලික)

ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර (තාවකාලික) සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙළ කර, 1970.10.17 දිනට හෝ ඊට පෙර පහත 9 ඡේදයේ නියම කර ඇති පරිදි ලේඛනගත තැපෑලෙන් මා වෙත එවිය යුතුය.

වැටුප් ක්‍රමය—වර්ෂයකට රු. 3,864—9 × 144—5,160 (ඒකාබද්ධ).

2. **වයස් සීමාව.**—අවුරුදු 25 කට නොඅඩු විය යුතු අතර, අවුරුදු 40 කට නොවැඩි විය යුතුය. රජයේ සේවකයින් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.

3. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :

(i) දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව, සහ අංක ගණිතය/ගණිතය, ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් තිබිය යුතුය ;

(ii) (අ) මෝටර් රථ කාර්මික විද්‍යාව පිළිබඳ ශිල්පී මට්ටමින් "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනයෙන් පිළිගත් සහතිකයක් හෝ මෝටර් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් කාර්මික ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා සහතිකයක් ;

හෝ

(ආ) මෝටර් රථ කර්මාන්ත ආයතනයේ ඒකාබද්ධ මණ්ඩලය ආශ්‍රිත සාමාජිකත්වය ;

හෝ

(ඇ) යටත් පිරිසෙයින් අවුරුදු දහයක කාර්මික පළපුරුද්දක් තිබීම. ඉන් අඩු වශයෙන් අවුරුදු 5ක් වත් පිළිගත් ගරාජයක හෝ කාර්මික ආයතනයක හෝ වගකිව යුතු පරිපාලන තිලයක කටයුතු කර තිබිය යුතු අතර, මෝටර් රථ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය ;

(iii) සියළුම වර්ගයේ මෝටර් කාර් සහ ලොරි පැදවීම සඳහා බලපත්‍රයක් තිබිය යුතුය ;

(iv) කම්කරු සංවිධානයෙහි හා මෝටර් රථවාහන සමූහයක් නඩත්තු කිරීමේ සහ වැඩපලෙහි සේවකයන් පරිපාලනය කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර තාවකාලිකය. තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

5. අයදුම්කරුවන් තමන්ගේ අයදුම් පත්‍රවලට පහත සඳහන් ලියකියවිලි (මුල් පිටපත නොව) අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය ;

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තිය සහතික ;

(iii) චරිතය පිළිබඳව මෑතදී ලබාගත් චරිත සහතික තුනක් (දැන් රජයේ සේවයේ නියුක්ත අය මෙම සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

6. රජයේ සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලැබ නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ගැන සලකා බලන්නේ එම අයදුම්පත් නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී ඇත්නම් හා ප්‍රමාදයට සෑහෙන හේතු දන්වමින් ඔවුන් ඒවා පිළිගත යුතුයැයි නිර්දේශ කරන්නේ නම් පමණි.

7. රජයේ සේවකයින්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා, නිලධාරියා පත්වීමක් ලැබීමට තෝරාගනු ලැබුවහොත් නිදහස් කරන බව සඳහන් කළොත් පමණි.

8. (i) තෝරාගනු ලබන අයදුම්කරු දිවයිනේ කිනම ස්ථානයක හෝ සේවය කළ යුතුය.

(ii) ස්ථිර ලේකම්තුමා විසින් නියම කරනු ලබන ආකාරයට ඇපයක් තෝරාගනු ලබන නිලධාරියා විසින් සැපයිය යුතුය.

9. අයදුම්පත් මගේ නමට හෝ මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට නොව, "අධ්‍යක්ෂ, ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව, රත්මලාන" යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

10. අයදුම්කරුවන් යම්කිසි නියමිත ස්ථානයකදී සහ වේලාවකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය වනු ඇත. ඉල්ලුම් පත්වලට අමුණා එවන ලද, සහතිකවල මුල් පිටපත් එම සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා හෝ ගෙවනු නොලැබේ.

11. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ රාජ්‍ය සේවා තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ආර්. වී. පෙරුමයිනාර්,
අධ්‍යක්ෂ.

ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව,
රත්මලාන.
1970.9.19.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ජලසම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර (තාවකාලික)

1 අයදුම්කරුගේ නම (පැහැදිලි අකුරෙන්) :—
මුල් නම :————.
වෙනත් නම් :————.

2. ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

3. උපන් දිනය :————.
1970.10.17 දිනට වයස : අවු.————, මාස————, දවස් ——.

4. පුරවැසිභාවය හා එය ලබාගත් අන්දම :—
(අ) පරම්පරාවෙන් ද ? :————.
(ආ) ලියාපදිංචි කිරීමෙන් ද ? :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පස මී මුත්තා :————.

6. අයදුම්කරුගෙ සිවිල් තත්ත්වය :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.
(සමත් වී ඇති උසස්ම විභාගය සඳහන් කරන්න).

8. දැන්වීමේ 3 වන ඡේදයේ 2 වන උප ඡේදය කුමන ඡේදයන් යටතේ සුදුසුකම් ලබා තිබේද :————.

9. ලබාඇති රියැදුරු බලපත්‍රයේ අංකය :————.

**සටහන.**—නිවේදනයේ 3 වන ඡේදයේ (i), (ii) හා iv) ඡේදයන් යටතේ විස්තර සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

10. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුරු, ලිපිනය :—
1. ————.
2. ————.
3. ————.

11. පාසැලෙන් අස්වූවාට පසු කරන ලද රැකිරක්ෂා පිළිබඳ විස්තර :————.

12. දැනට යෙදී සිටින රක්ෂාව :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගනු ලැබීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත්, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–106—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

අංකය : වීආ/4/107.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1971 කැනඩා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1971 සැප්තැම්බර් මැද සිට ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට කැනඩාවේ විශ්ව විද්‍යාලයන්හි ඉගෙනීම සඳහා කැනඩා රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

ලාංකික සිසුන්ට පශ්චාත් උපාධි අධ්‍යාපන හෝ පර්යේෂණ පිළිබඳ උසස් වැඩ සටහන් අනුගමනය කිරීමට අවස්ථාවක් ලබා දීම ශිෂ්‍යත්ව ප්‍රදානයන්ගේ අදහසයි.

අධ්‍යාපන ක්ෂේත්‍රයයන් සම්බන්ධයෙන් සීමාවක් නැත ද, දැනටමත් ආචාර්ය උපාධියක් දරන අපේක්ෂකයන්ට හෝ වෛද්‍ය උපාධි, දන්ත වෛද්‍ය උපාධි හා චිකිත්සාගාර පුහුණුව සඳහා මේ ශිෂ්‍යත්ව ප්‍රදානය නො කැරෙන බව සැලකිය යුතුයි.

**ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.**

**සංලක්ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂය 3 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අධ්‍යයන වර්ෂ දෙකක් හා අතරතුර ග්‍රීෂ්ම ඍතුව සඳහා වන්නේ ය. නියමිත අධ්‍යයන වැඩ සටහන සඳහා කෙටි කාලයක් ප්‍රමාණවත් වන අවස්ථාවන් හිදී ශිෂ්‍යත්ව කාලය කෙටිවනු ඇත. පාඨමාලාව සඳහා වැඩිදුර කාලයක් අවශ්‍ය නම් හා ශිෂ්‍යත්වධාරියාගේ වාර්තා සතුටුදායක නම් ප්‍රදානය දීර්ඝ කරනු ලැබීමට ඉඩ ඇත.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ කැනඩා බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

**3. සුදුසුකම් :** අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1971.10.1 වැනි දිනට, වයස අවුරුදු 35ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පාඨමාලාවට උචිත (පිළිගත් විශ්ව විද්‍යාලයයක) දෙවැනි පෙළ (ඉහළ ශ්‍රේණියේ) උපාධියක් තිබිය යුතුයි. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් බාර ගනු නොලැබේ.)

(iv) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය. (ඉහත 3 (III) ඡේදය යටතේ නියමිත සුදුසුකම් අනිවාර්ය ඒවාය. උසස් සුදුසුකම් හෝ සමාන සුදුසුකම් ඇති අය වුවද ඉහත සුදුසුකම් අවශ්‍යයෙන්ම ලබා සිටිය යුතුය.)

**සංලක්ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971.10.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) කැනඩාව බලා යාමේ සහ ආපසු පැමිණීමේ ගමන් වියදම් (සාමාන්‍යයෙන්, කැනඩා රජයේ විදේශ ආධාර කාර්යාලය විසින් පිළියෙල කරන පරිදි, ඉතාම කෙටි මගින් සංචාරක පන්තියේ ගුවන් ගමන් සඳහා).

(ආ) අනුමත කළ ඉගැන්වීමේ ගාස්තු හා විශ්ව විද්‍යාල ගාස්තු (කෑම බීම හා නේවාසික ගාස්තුව හැර).

(ඇ) මසකට ඩොලර් 210 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක්.

(ඈ) අනුමත කළ වෛද්‍ය හා ආරෝග්‍යශාලා වියදම්.

(ඉ) පොත් සඳහා අධ්‍යයන වර්ෂයකට ඩොලර් 120 බැගින් දීමනාවක්.

(ඊ) ඇඳුම් සඳහා ප්‍රථම වර්‍ෂයේ ඩොලර් 240ක හා ඊටපසු අවුරුදු වලට මසකට ඩොලර් 10 බැගින් දීමනාවක්.

(උ) විශේෂ අවස්ථාවන් හිදී, විශ්ව විද්‍යාලයෙහි නොමැති විශේෂ පොත්, උපකරණ හා සැපයීම් සඳහා දීමනාවක්.

(ඌ) විශේෂ අවස්ථාවන් හිදී, අධ්‍යාපන වැඩ සටහන සඳහා අවශ්‍ය වේ නම්, කැනඩාව ඇතුළත ගමන් වියදම් සඳහා ඩොලර් 800 කට නොවැඩි වන දීමනා.

(එ) කැනඩාවට යාමට පෙර විවාහකව සිටින ශිෂ්‍යත්වධාරීන් සඳහා දෙනු ලබන පහසුකම් පිළිබඳ විස්තර මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි කොටසේ පළවී ඇති ඉංග්‍රීසි නිවේදනයේ 4(අයි) ඡේදයේ සඳහන්ව ඇත.

(ඒ) මේ දීමනා සඳහා කැනඩාවේ දී බදු අය කරනු නොලැබේ.

**සංලක්ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

**5. සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලි වල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

**6. ගිවිසුම :** තෝරාගනු ලබන අපේක්ෂකයන් කැනඩා බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

**7. වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් කැනඩාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්‍ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුව හොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්වය ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයෙකු තෝරාගැනීම් සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ යථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහා අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයටම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත්, 1970.10.16 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන් රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතන් වල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු සි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් තම අයදුම් පත් ඒ ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂවරුන් මඟින් ඉදිරිපත් කළයුතුව ඇත.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 23 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

10–188—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### අනුරාධපුර කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු 1970-71

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අනුරාධපුර කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර අනුරාධපුර කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනයාධිපති වෙත 1970 ඔක්තෝබර් 22 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් තමතමන්ගේ අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද සියළුම විස්තර ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය. එක් එක් විෂය සඳහා ඉල්ලුම් පත් වෙන වෙනම තිබිය යුතුය.

2. අනුරාධපුර කාර්මික ආයතනයේ ඇති බාහිර උපදේශක ඇබෑර්තු අදාළ විෂයයන් මෙහි පහත සඳහන් කර ඇත. පංති පැවැත්වෙන මාධ්‍යය විෂය ඉදිරියෙන් පෙන්නුම් කෙරෙයි.

| | |
|---|---|
| 1. සිංහල භාෂාව. | සිංහල මාධ්‍යය |
| 2. ඉංග්‍රීසි භාෂාව. | |
| 3. වෑල්ඩින් වැඩ. | |
| 4. වඩු ඇඳීම. | |
| 5. ජලනල සවි කිරීම, න්‍යාය සහ ප්‍රායෝගික. | |
| 6. විදුලි කම්බි සවි කිරීම, න්‍යාය සහ ප්‍රායෝගික. | |
| 7. රේඩියෝ අළුත් වැඩියා න්‍යාය සහ ප්‍රායෝගික. | |
| 8. මූලික විද්‍යාව. | |
| 9. ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම. | |
| 10. ගණිතය. | |
| 11. තාපය එළිය හා ශබ්දය. | |
| 12. චුම්බකත්වය හා විදුලිය. | |
| 13. පෙදරේරු ශිල්පය. | |

3. බාහිර උපදේශකවරුන්ට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රුපියල් 2.50 සිට රුපියල් 15 දක්වා වෙනස් වෙනවා ඇත.

4. මෙම තනතුරු අවුරුද්දේ ඔක්තෝබර් මස පටන් ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වූද අවසන් කෙරෙනු ඇත.

5. පංති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සවස 4.30 දක්වා සහ සවස 5 සිට රාත්‍රි 7.15 දක්වාද හෙයින් මේ කාලය ඇතුලත ඉගැන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාල වේලා ඉල්ලුම් පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන්හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂකයන් නො යොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන්හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර ආයතනයාධිපති වෙත නොලැබුනොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී, පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාදවුවහොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදාල විෂයය පැහැදිලිව දැක්වීම ඉතා අවශ්‍යතාවයක් බව සැළකුව මැනවි.

ඩබ්ලිව්. ඞී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
උතුරු මැද ප්‍රදේශය.

1970 සැප්තැම්බර් 17 දින,
අනුරාධපුර,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

10–14—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## කම්කරු දෙපාර්තමේන්තුව

### ආපසු සියරට යන්නන්ගේ ශුභ සාධක නිලධාරි තනතුර

ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සභාපති සහ කම්කරු කෝමසාරිස්වරයා යටතේ ශුභසාධක නිලධාරී තනතුරක් (ආපසු සියරට යන්නන්ගේ) සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

1. වැටුප.—මසකට රු. 600 ක නියමිත වේතනයක් (සියළු දීමනා ඇතුළත්ව) ආගමන අරමුදලෙන් ගෙවනු ලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය, හෝ

(ii) වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් 6 ක් සාමාර්ථය ලබා තිබිය යුතුය.

(ආ) 70.9.30 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩුවිය යුතුය.

(ඇ) යටත් පිරිසෙයින් අවුරුදු 10 ක කාලයක් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක හෝ සංවිධානයක වගකිවයුතු සේවයේ යෙදී සිටිය යුත්තෝ විය යුතුය.

(ඈ) ගමන් බිමන් පිළියෙල කිරීම, රේගු වැඩ සහ ගමන් බිමන් සම්බන්ධිත විනිමය පාලන වැඩ පිළිබඳ දැනුමක් ලබා සිටිය යුතුය.

3. **වෙනත් කොන්දේසි :**

(අ) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. මාසයක දැනුම්දීමකින් සේවය අවසන් කළ හැකිය.

(ආ) තෝරාගත් ඉල්ලුම්කරුවා විසින් 1940 ආගමන දායක අර්ථ සාධක අරමුදල් නීතිවලින් නියම කර තිබෙන පරිදි, තම පඩියෙන් 1/10 කට සමාන මුදලක් ආගමන දායක අර මුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය.

(ඇ) තෝරාගනු ලබන අපේක්ෂකයා 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීතිවලට හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියාකළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(ඈ) තෝරාගනු ලබන අපේක්ෂකයාට තලේමන්නාරමේ සේවය කිරීමට සහ තල්මන්නාරමේ හෝ මන්නාරමේ පදිංචිව සිටීමට හෝ ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සභාපති සහ කම්කරු කොමසාරිස්වරයා නියම කරන පරිදි වෙන යම්කිසි ස්ථානයක වැඩ කිරීමට හෝ පදිංචිව සිටීමට අවශ්‍ය වේ.

(ඉ) රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් එවිය යුතුය.

4. අයදුම්පත්, කොළඹ 5, කම්කරු මහලේකම් කාර්යාලයේ කම්කරු කොමසාරිස් වෙත 1970 ඔක්තෝබර් මස 20 වැනි දිනට හෝ ඊට පෙර ලැබියයුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස් සහ ඉන්දියානු ආගාමික
කම්කරු මණ්ඩලයේ සභාපති.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 5,
1970 සැප්තැම්බර් මස 10 වැනි දින.

10–107—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## අක්කරෙයි පත්තු ගම්සභා කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීගේ බල ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කර 1970 ඔක්තෝබර් මස 23 දින දහවල් 12 ට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි. මේ දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

| බල ප්‍රදේශ | | | ග්‍රාම සේවක කොට්ඨාශ |
|---|---|---|---|
| 1. කට්ටකාඩු | ... | ... | (597) |
| 2. කොත්තන්තීවු | ... | ... | (598) |
| 3. කඩයාමොට්ටෙ | ... | ... | (599) |
| 4. විරුතෝඩෙයි | ... | ... | (601) |
| 5. තෝට්ටපෝලේ | ... | ... | (603) |
| 6. නාවක්කාඩු | ... | ... | (605) |

2. මෙම තනතුරු සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම :

(අ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බවට හෝ අවුරුදු 60 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) අක්කරෙයිපත්තු ගම්සභා කොට්ඨාශය තුළ ස්ථිර පදිංචි කරුවකු බවට,

(ඈ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතිකපත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවටත් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්. ඉන් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි.

(ඈ) ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

පී. ජී. පුංචිහේවා,
පුත්තලම දිසාපති.

දිසාපති කාර්යාලය,
පුත්තලම,
1970 සැප්තැම්බර් මස 23 දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

## අක්කරෙයි පත්තු ගම්සභා කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
 (අ) අගට යෙදෙන නම :————.
 (ආ) අනිකුත් නම් :————.
 (ඇ) ලිපිනය :————.
2. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
3. (අ) 1970 ඔක්තෝබර් මස 23 වැනි දිනට වයස :
 අවු :——, මාස :——, දවස් :——.
 (ආ) උපන් දිනය හා ස්ථානය :————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. දැනට කරන රක්ෂාව :————.
7. ණය ගැති වී තිබේ ද ? එසේ නම් විස්තර :————.
8. තමා සතු දේපලවල ප්‍රමාණය හා වටිනාකම :————.
9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේ ද ? එසේ නම් විස්තර :————.
10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත් නම් ඒ වා :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා නිලයෙන් පහ කරනු ලැබීමට ද යටත් විය යුතු බව දනිමි. මෙම අයදුම්පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–91—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ පාඨශාලාවල පෙරදිග සංගීත/නැටුම් පිළිබඳ ගුරු තනතුරු

රජයේ පාඨශාලාවල පෙරදිග සංගීතය හා නැටුම් පිළිබඳ ගුරු තනතුරු සඳහා (ගැහැණු පිරිමි දෙපක්ෂයෙන්ම) අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් කරනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කළ යුතු ඉල්ලුම් පත්‍ර 1970 ඔක්තෝබර් මස 25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, සථිර ලේකම් (පාසල් පරිපාලන ශාඛාව) වෙත එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ උඩ වම් කෙළවරේ “පෙරදිග සංගීතය/නැටුම් පිළිබඳ ගුරු තනතුරු” යනුවෙන් සඳහන් කළ යුතුය.

2. මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රම මෙසේය :—

(i) **පෙරදිග සංගීතය/නැටුම් පිළිබඳ ගුරුවරු.**—

(අ) ඉන්දියාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක පෙරදිග සංගීතය සහ/හෝ නැටුම් පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍රයක්, දරණ අය හෝ රජයේ ලලිත කලායතනයේ/රජයේ සංගීත/නැටුම් විද්‍යාලයේ සංගීතය/නැටුම් පිළිබඳ අවසාන සහතික පත්‍රය දරණ අය සඳහා කල්පිත වැටුප් ක්‍රමය රු. 1,920 න් පටන්ගෙන රු. 72 වාර්ෂික වැඩිවීම් 10 කින් සහ රු. 120 වාර්ෂික වැඩිවීම් 5 කින් රු. 3,240 දක්වා නගී.

**ඒකාබද්ධ වැටුප් ක්‍රමය :** රු. 4,170 න් පටන්ගෙන රු. 90 වාර්ෂික පඩි වැඩිවීම් 11 කින් සහ රු. 144 වාර්ෂික පඩි වැඩිවීම් 5 කින් රු. 5,880 දක්වා නගී.

(ආ) ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ සංගීත/නැටුම් විභාගයේ හෝ උත්තර ලංකා පෙරදිග සංගීත සංගමයේ අවසාන සහතික පත්‍රය හෝ රජයේ ලලිතකලායතනයේ/රජයේ සංගීතය/නැටුම් විද්‍යාලයේ සංගීතය සහ/හෝ නැටුම් පිළිබඳ අන්තර් මධ්‍යම සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක ඩිප්ලෝමාවට ඉගැන්වෙන අන්තර් මධ්‍යම විභාග තත්ත්වයේ වෙනත් සහතික පත්‍රයක් දරණ අය සඳහා—

**කල්පිත වැටුප් ක්‍රමය : රු. 1,344 න් පටන්ගෙන රු. 72 වාර්ෂික පඩි වැඩිවීම් 17 කින් රු. 2,568 දක්වා නගී.**

**ඒකාබද්ධ වැටුප් ක්‍රමය :** රු. 3,450 න් පටන්ගෙන රු. 90 වාර්ෂික පඩි වැඩිවීම් 17 කින් රු. 4,980 දක්වා නගී.

(ඉ) උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයේ/අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සංගීත විෂය සමත් අය හෝ ලංකා ගාන්ධර්ව සභාවේ/රජයේ සංගීත/නැටුම් විභාගයේ හෝ උත්තර ලංකා පෙරදිග සංගීත සංගමයේ අන්තර් මධ්‍ය සහතික පත්‍රය දරණ අය හෝ සංගීතය සඳහා සම්මාන සාමාර්ථයක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක් සමත් අය සඳහා—

**කල්පිත වැටුප් ක්‍රමය :** රු. 918 න් පටන්ගෙන රු. 42 වාර්ෂික පඩි වැඩිවීම් 13 කින් රු. 1,464 දක්වා නගී.

**ඒකාබද්ධ වැටුප් ක්‍රමය :** රු. 2,880 න් පටන්ගෙන රු. 60 වාර්ෂික පඩි වැඩිවීම් 13 කින් රු. 3,660 දක්වා නගී.

(ii) නියමිත ප්‍රමාණයන් අනුව විවාහක දීමනාව ගෙවනු ලැබේ.

3. **සුදුසුකම් :**

සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉහත 2 වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපන සහතික එකක් හෝ වැඩි ගණනක් ලබා ඇති බව.

(ආ) 1970.10.25 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).

(ඉ) විශිෂ්ඨ චරිතයෙන් යුක්ත බව.

(ඊ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති බව සහ එසේ කිරීමට ශාරීරික වශයෙන් සුදුසු බව.

(උ) ලංකාවේ පුරවැසියෙක් බව.

4. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(අ) තනතුරු සථිර හා විශ්‍රාම වැටුප් රහිතය.

(ආ) පත්කරනු ලබන පිරිමි අපේක්ෂකයා විසින් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**(ඉ) ආධුනික කාලය අවුරුදු 3 ක් වේ.**

(ඊ) (i) සංගීතය හා නැටුම් පිළිබඳ ගුරු (සිංහල) තනතුරුවලට පත් කරනු ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් ඇතුළත දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල භාෂාවෙන් හෝ සිංහල සාහිත්‍යයෙන් සාමාර්ථයක් ලබාගත යුතුය. සිංහල සුදුසුකම් ලබාගැනීම සඳහා අවුරුදු තුන ඉක්මවා ගතවන කාලය පඩි වැඩිවීම නැවැත්වීමේ කාලයක් හා ආධුනික කාලය දීර්ඝ කිරීමක් වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

(ii) සංගීතය හා නැටුම් පිළිබඳ ගුරු (දෙමළ) තනතුරුවලට පත්කරනු ලබන අපේක්ෂකයින් පත්කරනු ලබන දිනයේ සිට අවුරුදු 3 ක් ඇතුළත දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවෙන් හෝ දෙමළ සාහිත්‍යයෙන් සාමාර්ථ්‍යයක් ලබාගත යුතුය. දෙමළ සුදුසුකම් ලබා ගැනීම සඳහා අවුරුදු තුන ඉක්මවා ගතවන කාලය පඩි වැඩිවීම නැවැත්වීමේ කාලයක් හා ආධුනික කාලය දීර්ඝ කිරීමක් වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

(උ) පත්කරනු ලබන අපේක්ෂකයින් විසින් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා ද, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් පනවා ඇති ව්‍යවස්ථා හෝ මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා හෝ පිළිපැදීම අවශ්‍ය වන්නේය.

(ඌ) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි පරිපාලන රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හා රෙගුලාසි යන මේවාට සහ රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

5. අපේක්ෂකයන් විසින් මෙහි පහත දක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) සවකීය ඉල්ලුම්පත්‍රවලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාල අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් විය යුතුය.

**සටහන : 1.**

ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුත්තේ සහතික පත්‍රවල මුල් පිටපත් නොව පිටපත් පමණකි.

**සටහන : 2.**

ඉහත සඳහන් ලියකියවිලිවල පිටපත් අමුණා එවීම පැහැර හරින අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන : 3.**

පත් කරනු ලබන අවස්ථාවේ දී ඉල්ලා එවූ විට ඉහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මගින් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් සහ ඒ පිළිබඳ සෙසු ලියකියවිලි එවිය යුත්තේ අමාත්‍යාංශයේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව මෙම නිවේදනයේ I වැනි ඡේදය අනුවය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූද පොදු කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය පසුවී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

10. තැපැලේදී සිදුවිය හැකි කවර හෝ ප්‍රමාදයක් මගහරවා ගැනීම වස් සවකීය ඉල්ලුම් පත් කල් ඇතිව ලියාපදිංචි තැපැලෙන් එවන මෙන් ඉල්ලුම්කරුවන්ට අවවාද කරනු ලැබේ.

පී. උඩගම,
සථිර ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

**රජයේ පාඨශාලාවල පෙරදිග සංගීතය හා නැටුම් පිළිබඳ ගුරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග) (පැහැදිලි අකුරෙන්) : ————.
2. ගෙදර ලිපිනය :————.
3. ස්ත්‍රී-පුරුෂ භාවය :————.
4. ජාතිය :————.
   ලාංකිකයෙකු වන්නේ පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග :————.
5. විවාහක ද, අවිවාහක ද යන වග :————.
6. උපන් දිනය සහ ස්ථානය :————.
7. 1970.10.25 දිනට වයස :————.
8. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
9. අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.
10. පෙරදිග සංගීතය හා නැටුම් පිළිබඳ ලබා ඇති සුදුසුකම් :—
    (i) ලබා ඇති සහතිකය :————.
    (ii) සහතිකය ලැබූ වර්ෂය :————.
11. අධ්‍යාපන සුදුසුකම් :————.
12. සිංහල/දෙමළ පිළිබඳ ලබා ඇති උසස්ම සුදුසුකම් :————.
13. විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.
14. කලින් රක්ෂාවක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සහ එයින් අස්වීමට හේතු :————.
15. දැනට රක්ෂාවක යෙදී සිටින්නේ නම් එය :————.
16. තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබීමට කැමති දිස්ත්‍රික්ක පහක් (ප්‍රමුඛතා අනුපිළිවෙලට සඳහන් කරන්න) :—
    (1) ..............................................
    (2) ..............................................
    (3) ..............................................
    (4) ..............................................
    (5) ..............................................

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයේ යම් කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීම නුසුදුස්සකු බවට පැමිණෙනවා පමණක් නොව තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–143—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

**දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ රජයේ පාසල්වලට උපගුරුවරුන් බඳවා ගැනීම**

උපගුරු තනතුරුවලට පත් කිරීම සඳහා සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඉංග්‍රීසි උපගුරු සහතිකපත්‍ර විභාගයෙන් හෝ සාමාර්ථය ලත් අයගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

සේවයේ නියුක්ත ශික්ෂ්‍ය ගුරුවරුන් මෙම නිවේදනය අනුව ඉල්ලුම් නොකළ යුතුය.

2. සහතිකපත්‍ර ලත් ගුරුවරුන් සඳහා පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්ක මෙසේ ය :

(1) පොලොන්නරුව
(2) අනුරාධපුරය
(3) නුවරඑළිය
(4) අම්පාරේ
(5) ත්‍රිකුණාමලය
(6) බණ්ඩාරවෙල
(7) මොනරාගල
(8) කුරුණෑගල
(9) හම්බන්තොට
(10) හලාවත
(11) යාපනය
(12) මඩකලපුව
(13) මාතලේ
(14) පුත්තලම
(15) ගාල්ල (හිනිදුම)
(16) රත්නපුර
(17) වවුනියාව
(18) මන්නාරම.

ඉහත නියමිත වශයෙන් සඳහන් කර ඇති පුරප්පාඩු හැරුණ විට බහුල වශයෙන් සිංහල ජනයා පදිංචි ප්‍රදේශවල දෙමළ මාධ්‍ය ගුරුවරුන් සඳහා ද බහුල වශයෙන් ද්‍රවිඩ ජනයා පදිංචි ප්‍රදේශවල සිංහල මාධ්‍ය ගුරුවරුන් සඳහා ද පුරප්පාඩු සීමිත සංඛ්‍යාවක් පවතී. පාසැල්වල විශේෂ අවශ්‍යතාවන් සඳහා එම පුරප්පාඩු පුරවනු ඇත.

3. තමා පත් කර තිබෙන දිස්ත්‍රික්කයේම සේවය කරන බවටත්, කවර හේතුවක් නිසාවත් දිස්ත්‍රික්කයෙන් බැහැර ස්ථාන මාරුවක් ලබා ගැනීම සඳහා ඉල්ලීම නොකරන බවටත්, පත් කිරීම සඳහා තෝරාගනු ලැබූ සෑම අයදුම්කරුවෙකු විසින් ම ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

4. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළයුතු ආකෘතිපත්‍රය අනුව පිළියෙල කළයුතු ඉල්ලුම්පත්‍ර 1970.10.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතිකපත්‍ර දරන්නන් සඳහා උපගුරු තනතුරු" යනුවෙන් සඳහන්ව තිබිය යුතුය.

5. **සුදුසුකම්.**—සෑම අයම්දුකරුවෙකු/අයදුම්කාරියක විසින් ම තමා සම්බන්ධ පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1970.10.25 දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත අය සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතිකපත්‍රය හෝ ඉංග්‍රීසි උපගුරු සහතිකපත්‍රය හෝ දරන බව හා

(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත බව.

6. අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් සිය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවින්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ.)

(ආ) දරන ගුරු සහතික පත්‍රය.

(ඉ) චරිත සහතික දෙකක්. මින් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් විය යුතුයි.

දිස්ත්‍රික්ක සේවා ක්‍රමය යටතේ බඳවා ගන්නා ගුරුවරුන් ඔවුන්ගේ මුළු ගුරු සේවා කාලයම ඔවුන් පත් කරනු ලබන දිස්ත්‍රික්කය තුළ සේවය කිරීමට නියමිතය.

7. වැටුප හා දීමනා :—

(i) සිංහල/දෙමළ ගුරු සහතිකපත්‍රය දරන්නන් සඳහා—
කල්පිත වාර්ෂික වැටුප—රු. 768—2 × 30—828.
ඒකාබද්ධ වාර්ෂික වැටුප—රු. 2,640—2 × 54—2,748.

(ii) ඉංග්‍රීසි ගුරු සහතික පත්‍රය දරන්නන් සඳහා—
කල්පිත වාර්ෂික වැටුප—රු. 1,056—2 × 72—1,200.
ඒකාබද්ධ වාර්ෂික වැටුප—රු. 3,090—4 × 90—3,456.

(iii) ඉංග්‍රීසි උපගුරු සහතිකපත්‍රය දරන්නන් සඳහා—
කල්පිත වාර්ෂික වැටුප—රු. 768—2 × 30, 5 × 36, 12 × 42—1,512.
කාර්යක්ෂමතා කඩඉම රු. 864 ට හා රු. 1,000 ට පෙර.
ඒකාබද්ධ වාර්ෂික වැටුප—රු. 2,640—19 × 60—3,780.

(iv) නියමිත ප්‍රමාණයන්ට අනුව විවාහක දීමනාව ගෙවනු ලැබේ.

8. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම් ලබන පිරිමි අය විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම් ලබන අය දැනටම රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි සේවයේ යෙදී නොසිටිත් නම් තුන් අවුරුදු ආධුනික කාලය කට යටත්ව පත් කරනු ලැබේ. තෝරාගනු ලැබූ දැනටම රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි සේවයේ නියුක්ත අයෙකු විසින් එක් අවුරුදු කාලයක් තනතුරේ වැඩ බැලීම අවශ්‍ය වනු ඇත.

(iv) තෝරාගනු ලැබූ අයැදුම්කරු විසින් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීම අවශ්‍ය වන අතර එසේ කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.

(v) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද තෝරා පත් කරගනු ලැබූවන් අනුකූල විය යුතුය.

9. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් සිය ඉල්ලුම් පත්‍ර තම දෙපාතර්මේන්තු ප්‍රධානයා මගින් ඉදිරිපත් කළ යුතුය.

10. ඉල්ලුම්පත්‍ර හා ඒවා සම්බන්ධ වෙනත් ලියකියවිලි ආදිය මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොව ස්ථිර ලේකම් වෙත එවිය යුතුය.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

12. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය පසුවී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. තැපෑලේදී සිදුවිය හැකි කවර හෝ ප්‍රමාදයක් මග හැරවීම සඳහා සිය ඉල්ලුම්පත්‍ර කල්වේලා ඇතිව ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970. සැප්තැම්බර් මස 21 වෙනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### උපගුරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය මුලට)

2. ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. විවාහක අවිවාහක බව :————.
(විවාහක නම්, ස්වාමිපුරුෂයා/භාර්යාව රජයේ සේවකයෙක්ද යන වග)
(විස්තර සඳහන් කරන්න.)

5. උපන් දිනය හා ස්ථානය :————.

6. වයස, 1970. 10. 25 දිනට :————.

7. උපන් ස්ථානය :————.
(අ) අයදුම්කරුගේ පියාගේ :————.
(ආ) අයදුම්කරුගේ මවගේ :————.

8. (අ) ජාතිය :————.
(ආ) ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද එසේ නැතහොත් ලියාපදිංචිවීමෙන් ද යන වග :————.

9. අධ්‍යාපන සුදුසුකම් :————.

10. සිංහල/දෙමළ සුදුසුකම් :————.

11. වෘත්තීය සුදුසුකම් :————.
(දරන සහතිකය)
(අ) සහතික පත්‍රයේ අංකය :————.
(ආ) සහතිකපත්‍රය වලංගු වූ දිනය :————.

12. කලින් සේවය කර තිබේ නම් එය :————.
(i) ගුරුවරයෙකු වශයෙන් :—
(අ) ලියාපදිංචි වූ අංකය :————.
(ආ) සේවා සටහන :————.
පාසැලේ නම :————. සිට දක්වා
දැරූ තනතුර :————.
(ii) රජයේ වෙනත් සේවයක :—
දැරූ තනතුර :————. සිට දක්වා

13. ගුරුවරයෙකු/රජයේ සේවකයෙකු වශයෙන් සේවය අවසන් කිරීමට/නැවැත්වීමට/ඉල්ලා අස්වීමට/නිදහස් කිරීමට හේතු :—
(සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.)

14. තෝරාගනු ලැබීනම් ඔබ මුල් පත්වීම් ලැබීමට කැමති දිස්ත්‍රික්ක පහක් කැමැත්තෙන් අනුපිළිවෙලට සඳහන් කරන්න.

(1) ..............................
(2) ..............................
(3) ..............................
(4) ..............................
(5) ....................... ......

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකරනු ලැබූ අයෙකු හෝ තනතුර හැරගිය ලෙස සලකනු ලැබූ අයෙකු නොවන බවද, පෙළපතින්/ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු බවද, දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානම් බවද තවදුරටත් ප්‍රකාශ කරමි. මෙම අයදුම්පත්‍රයේ අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයා ගනු ලැබුව හොත් තේරීමට කලින්, මා නුසුදුසුවීමටත්, පත්වීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමටත්, මා යටත් බවද දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–140—70.10.2 දින අංක 14 926 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

මෙම සංස්ථාවෙහි පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ

වැඩ බලන සේවක මණ්ඩල කළමනාකාර තැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලු පාර,
කොළඹ 3

යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරු ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයන් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි දක්වා ඇති වැටුප් ක්‍රමයන් ඒකාබද්ධ වැටුප් ක්‍රමයන් වේ.

5. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ සංස්ථාවන්හි හෝ සේවක යින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965 අගෝස්තු 20 වෙනි දින දරණ චක්‍රලේඛනයෙහි දැක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළයුතුය.

6. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල නොවනු ඉල්ලුම්පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

7. **සේවා කොන්දේසි.**—(i) තෝරාගනු ලබන අයදුම්කරුවන්—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දැක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණ යකින් සමත් විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට දහයක් (10%)ක් දායක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට පහළොවක් (15%)ක් දායක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කායර්‍යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යය.

(ii) මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

**තනතුර හා වැටුප් පරිමාණය**

ජී 2/3 ශ්‍රෙණියේ
සේවක මණ්ඩල කළමනාකාර
රු. 1,500—2,000

10 × 50

**අවශ්‍ය සුදුසුකම්**

(අ) ඉල්ලුම්කරුවන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබිය යුතු අතර, ජ්‍යෙෂ්ඨ පරිපාලනමය තත්ව යේ පිරිස් පාලන, කම්කරු හා කාර්මික සම්බන්ධතා කට යුතුවල යටත්පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ආ) යටත්පිරිසෙයින් සේවක සංඛ්‍යාව දහසක් හෝ ඊට වැඩියත් සිටින ආයතනයක පිරිස් පාලන කටයුතුවල පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) සිංහල භාෂාව පිළිබඳ මනා ප්‍රවීණතාවයක් තිබිය යුතුය.

වැඩ බලන සේවක මණ්ඩල කළමනාකාර තැන.

1970 සැප්තැම්බර් මස 25 වැනි දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය ප්‍රථමයෙන්)

3. මුල් අකුරු සමග නම :————.

4. ලිපිනය :————.

5. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

6. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

7. පුරවැසිභාවය :————.
(උත්පත්තියෙන්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග)

8. විවාහක/අවිවාහක බව :
අවිවාහක බව :——. විවාහක බව :——. දික්කසාද බව :——.

9. අධ්‍යාපනික පසුබිම :

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල්) | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| .................. | .................. | ............ | ............ | ............ |
| .................. | .................. | ............ | ............ | ............ |
| .................. | .................. | ............ | ............ | ............ |

10. වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබෙනම් :————.

11. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| .................. | ............ | ............ | ............ | .................. |
| .................. | ............ | ............ | ............ | .................. |
| .................. | ............ | ............ | ............ | .................. |
| .................. | ............ | ............ | ............ | .................. |

12. දිනට ලබන වැටුප :————.

13. විශේෂ සුදුසුකම් ඇත්නම් :————.
(ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න.)

14. වෙනත් කරුණු :————.

15. මෙම දැන්වීමේ තනතුරු සඳහා '' අවශ්‍ය සුදුසුකම් '' යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදල සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුණි නම් මගේ ඉල්ලුම්පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුණි නම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහ කරනු ලබන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ————,

10–121—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, කැළණිය

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

උද්භිද විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්‍ය
සරප්—III ශ්‍රේණිය
විනයාරක්ෂක
ගබඩාකරු
වාප් පුලිපිකරු

අයදුම්පත් භාරගන්නා අවසාන දින 1970 ඔක්තෝබර් 16 වේ.
අයදුම්පත් හා වෙනත් විස්තර විශ්ව විද්‍යාලයීය කායර්‍යාලයෙන් ලබාගත හැක. ඒ සඳහා තැපෑලෙන් කරන ඉල්ලීම් සමග නම හා ලිපිනය සහිත 9″ × 4″ ප්‍රමාණයෙන් මුද්දර කවරයක් එවිය යුතුය.

වැඩ බලන ලේකම්.

10–161—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## පුහුණුව ලබන කාර්මික සහායක තනතුරු

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පුහුණුව ලබන කාර්මික සහායක තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් ලද සම්මාන සාමාර්ථය ඇතිව, දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ, ඊට සමාන හෝ, ඊට උසස් විභාගයකින් ලත් සාමාර්ථය. යාන්ත්‍රික චිත්‍ර කර්මයෙන් සහ/හෝ රසායන විද්‍යාවෙන් සමර්ථ වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස.**—අවුරුදු 17–22 දක්වා.

**පුහුණුවීමේ කාලය තුළ දීමනා.**—ප්‍රගතිය හා හැසිරීම සතුටුදායකවීමේ කොන්දේසිය මත, පුහුණුවීම ආරම්භ කළ දින සිට III වෙනි ශ්‍රෙණියේ කාර්මික සහායක තනතුරට පත් කරන තුරු, පහත සඳහන් ප්‍රමාණය අනුව දීමනා ගෙවනු ලැබේ.

පළමු වර්ෂය : සියලු දීමනා ඇතුළත්ව දිනකට රු. 7 බැගින්,
දෙවන වර්ෂය : සියලු දීමනා ඇතුළත්ව දිනකට රු. 8 බැගින්,
තෙවැනි වර්ෂය : සියලු දීමනා ඇතුළත්ව දිනකට රු. 9 බැගින්.

**බැඳුම්කර හා ගිවිසුම්.**—පුහුණුව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් ඇපකරුවන් දෙදෙනෙකු ඇතුළුව රු. 3,000 ක බැඳුම්කරයකට හා ගිවිසුම කට අත්සන් තැබිය යුතුයි.

පුහුණුව ලබන කාලය තුළදී හෝ පුහුණුව අවසාන වී පස් අවුරුද්දක් ඇතුළතදී හෝ අයදුම්කරුවකු සේවයෙන් ඉවත් වුවහොත් ඔහු ලද පුහුණුව වෙනුවෙන්, සංස්ථාව මගින් ගෙවනලද හෝ දැරීමට සිදුවූ සියළුම මුදල් ප්‍රමාණය සහ ඔහුගේ පැහැර හැරීමක් හෝ නොසැලකිල්ල නිසා හෝ නැති වූ හෝ අලාභහානි සිදුවූ හෝ යම් භාණ්ඩවල වටිනාකමද ඔහු විසින් ආපසු ගෙවිය යුතුය.

**ඇප.**—අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන පරිදි ඇප සැලසීමද අවශ්‍ය වේ.

**පත්වීම.**—පුහුණුවීමේ කාලය තුළ අයදුම්කරුවන් විසින් ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ විදුලි සංදේශ කාර්මිකයින් සඳහාවූ පාඨමාලාවේ මධ්‍ය සහතිකය ලබාගත යුතුයි. සාර්ථක අන්දමින් පුහුණුව අවසන් කළ පසු ඔවුන් රු. 350—505 (15×5—20×4) වැටුප් ක්‍රමය මත III ශ්‍රෙණියේ කාර්මික සහායක තනතුරුවලට පත් කරනු ලැබේ. ඉනික්බිතිව ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය යටතේ II ශ්‍රෙණියේ සහ I වන ශ්‍රෙණියේ කාර්මික සහායක තනතුරුවලට උසස්වීම් දෙනු ලැබේ.

ඉලෙක්ට්‍රොනික් සහ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳව දැනටමත් පුහුණුවක් ලබා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් වයස් සීමාව සහ ඉහත සඳහන් පුහුණුවීමේ කාලසීමාව ලිහිල් කළ හැකිය.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 ඔක්තෝබර් මස 16 වැනි දිනට ප්‍රථම කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ලිපිකරුවන් ඉහළ වම් කෙළවර 'පුහුණුව ලබන කාර්මික සහායක' යනුවෙන් සඳහන් කළ යුතු වේ.

සුසිල් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ 7,
ලංකා ගුවන් විදුලි සංස්ථාවේදී ය.

### නිදර්ශන අයදුම් පත

ලංකා ගුවන් විදුලි සංස්ථාව

........................තනතුරු සඳහා අයදුම්පතයි

1. සම්පූර්ණ නම :————.
   (අ) මුල් අකුරු සහිත නම :————.
   (මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යන වග සඳහන් කරන්න).
2. පුද්ගලික ලිපිනය :————.
3. උපන් දිනය :————.
   1970 ඔක්තෝබර් 16 වැනි දිනට වයස : අවු :——මාස : ——දින :—
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය).
4. ජාතිය :————.
5. අධ්‍යාපන හා පුහුණුවීම් :————.

| අධ්‍යාපනය ලැබූ පාසල් හා ආයතන | දින ............සිට ......... දක්වා | සමත්වී ඇති විභාගය | දරු වගකිවයුතු තත්ත්ව හා යෙදුනු පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | | | |

6. සමත්වී ඇති උසස්ම විභාගය :————.
   සිංහල :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුය).
7. පළපුරුද්ද :————.
   (ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාලක්‍රමානුගතව යොදන්න).
8. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්න නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :—
   (1)
   (2)
   (3)
9. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :—
   (1)
   (2)
   (3)
10. වෙනත් විස්තර :————

මා ඉහත ප්‍රකාශකොට ඇති කරුණු නිවැරදි හා සත්‍ය තොරතුරු බවත්, මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහත දෙන්නට යෙදුන අසත්‍ය හෝ වැරදි තොරතුරක් වේතොත් එම හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම ලැබීමට මා සුදුස්සෙකු වන බවත් විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදාල වැදගත් කිසියම් කරුණක් පිළිබඳව හෝ හිතා මතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමක් මට එල්ලවන බවත් මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–160—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇම්. 115 (අට. කෝ.)
1970.9.18 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

## අටකලන් කෝරළේ, මැදපත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවීම

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළයේ මැදපත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයක් සඳහා අයදුම්පත් 1970 ඔක්තෝබර් මස 31 වැනි දින ප. ව. 12.30 තෙක්, රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ.

2. **අයදුම්පත් භාරගනු ලබන්නේ අටකලන් කෝරළේ, මැදපත්තුවේ රක්වාන සුළු නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණකි.**

3. තෝරාගත් අපේක්ෂකයා රක්වාන මධ්‍යස්ථානය කොට සේවය කළ යුතු වේ.

4. රජයේ සේවකයින්ගෙන් හෝ පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

5. වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි අය මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ නොවෙති.

6. සියළුම අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව, අයදුම්කරුගේ **අත් අකුරින්ම** පිළියෙල කොට, **ලියාපදිංචි කළ** තැපෑලෙන් එවිය යුතුය. මුද්‍රිත ඉල්ලුම්පත් පෝරම මෙම කාර්යාලයේ නොමැති බව සැලකිය යුතුයි.

7. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් කිසිවෙකුට මා හමුවී සාකච්ඡා කිරීමට ඉඩ දෙනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

ඇස්. ජී. සමරසිංහ,
රත්නපුර දිසාපති.

### ආදර්ශ අයදුම් පත

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. පදිංචි ග්‍රාම සේවක වසම :————.
4. පදිංචි ගම හා එය අයත් සුළු නගර සභා කොට්ඨාශය :————
5. උපන් දිනය :————.
6. 70. 10. 31 දිනට වයස :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. අධ්‍යාපන සුදුසුකම් :————.
10. වෙනත් විශේෂ සුදුසුකම් :————.
11. අයදුම්කරුවන්ට අයත් දේපළ පිළිබඳ විස්තර :————.

(තමාට අයිති දේපළ ආදිය උකසට යට වී ඇත්තේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වෙන දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කළ යුතුය.)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–4—70.10 2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ව්‍යාප්ති නිලධාරි තනතුරු

ව්‍යාප්ති නිලධාරි තනතුරුවල පුරප්පාඩු සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් අයදුම්පත් ඉල්ලුම්කරුගේ අත් අකුරින් පුරවා, කොළඹ 2 වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ සතොස සේවක මණ්ඩල කළමනාකරු වෙත 1970 ඔක්තෝබර් 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය :—

2. ඉල්ලුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ '' ව්‍යාප්ති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතු ය.

3. මෙම තනතුරට අදල ඒකාබද්ධ වැටුප මසකට රු. 350—15 × 10—20 × 7—රු. 640 ක් වේ.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—ක්ෂේත්‍ර නිලධාරින් වන මොවුන්ට ගමන් වියදම් දීමනා ගෙවනු ලැබේ. ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ යුතු අතර, අවශ්‍ය සියලු රාජකාරි ගමන් වලද යෙදිය යුතුය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම 1970.10.10 වැනි දිනට අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි බව සනාථ කිරීමට සෑහෙන සාක්ෂ ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේ විෂයයන් හයකින් සමත්ව සිටිය යුතු ය. එසේ නැතහොත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත් විභාගයෙන් හෝ ඊට උසස් අන් විභාගයකින් සමත්ව සිටිය යුතු අතර සමුපකාර ව්‍යාපාරය සා මහජන සම්බන්ධතා වැඩ කටයුතු පිළිබඳ පළ පුරුද්දක් ලබා තිබිය යුතු ය.

6. පහත සඳහන් සහතිකවල පිටපත් අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට අමුනා එවිය යුතු ය. :—

(අ) තම සුදුසුකම් පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක්,

(ආ) අධ්‍යාපන සහතික,

(ඇ) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

7. **සේවා කොන්දේසි.**—තෝරා ගත් අයදුම්කරුවන් පහත දක්වෙන රෙගුලාසි වලට යටත් විය යුතු ය. :—

(අ) එක් වසරක පරිවාස කාලයකට යටත්වීම ;

(ආ) සංස්ථාවේ දැනට පවතින සහ මින් ඉදිරියට පනවන නියමයන් හා රෙගුලාසි පිළිපැදීම. ;

(ඇ) දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම ;

(ඈ) සේවක අර්ථ සාධක අරමුදලට වැටුපෙන් සියයට 10 ක් ගෙවීම. (සංස්ථාවේ දායක මුදල සම්පූර්ණ වැටුපෙන් සියයට 15 ක් වේ.)

රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ නියමයන් හා දැනට පවතින හෝ මින් ඉදිරියට පනවන රෙගුලාසි පිළිපැදීමේ කොන්දේසිය, තෝරාගත් සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු ය.

දැනට ලබන වැටුප, පළපුරුද්ද හා සුදුසුකම් ගැන සළකා තෝරාගත් අයදුම්කරුවන් ඉහත දක්වෙන වැටුප් හිණෙහි සුදුසු පියවරක තබනු ලැබේ.

ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ.

සේවක මණ්ඩල කළමනාකරු.

1970 සැප්තැම්බර් මස 19 වෙනි දින,
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව,
අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

#### සතොස ව්‍යාප්ති නිලධාරි තනතුරු

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. අයදුම්කරු ස්ථිරව පදිංචිව සිටින පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශයේ අංකය හා නම :————.
4. උපන් දිනය :—
   (අ) 1970.10.10 වැනි දිනට නියම වයස :————.
5. ජාතිය :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. කලින් කරන ලද රැකියාවන් :—

| සේව්‍යයාගේ නම | සේවය ආරම්භ කළ දිනය | සේවය අවසන් කළ දිනය | දරණ ලද තනතුර හා ලැබූ වැටුප |
|---|---|---|---|
| (අ) | | | |
| (ආ) | | | |
| (ඇ) | | | |
| (ඈ) | | | |
| (ඉ) | | | |

8. තමුන් ගැන හොඳින් දන්නා වැදගත් පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :—

   (අ) ————,
   ————,
   ————.

   (ආ) ————,
   ————.
   ————.

9. වෙනත් විශේෂ සුදුසුකම්/ඉල්ලීම් ඇත්නම් ඒවා :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය::————.

10–128—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් තූයඹීවාදක කණ්ඩායමට ආධුනික තූයඹීවාදකයින් බඳවා ගැනීම

ලංකා පොලිස් තූයඹීවාදක කණ්ඩායමට ආධුනික වාදකයින් වශයෙන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් භාර ගනු ලැබේ. තෝරා ගනු ලබන ආධුනිකයන් බම්බලපිටියේ හෝ වාමධ්‍යස්ථානයේ පොලිස් තූයඹීවාදක කණ්ඩායමට ඇතුළත් කරනු ලැබේ. ඔවුන්ට රු. 50 මාසික දීමනාවක් ගෙවනු ලැබේ. ඔවුන් සියළුම අවශ්‍යතාවයන් සපුරණ ලදුයේ නම් ලංකා පොලිස් තූයඹීවාදක කණ්ඩායමේ පොලිස් කොස්තාපල්වරයකු වශයෙන් බඳවා ගනු ලැබේ. එසේ බඳවා ගත හොත් ඔවුන්ට රු. 220 ක මාසික ඒකාබද්ධ වැටුපක් ගෙවනු ලැබේ.

2. **පොදු කොන්දේසි.—**

(1) ලාංකික විය යුතුයි.

(2) 1970 ජූනි මස 30 වෙනි දිනට වයස අවුරුදු 18 කට නොඅඩු විය යුතු අතර අවු. 24 කට වැඩි නොවිය යුතුයි. (වයස සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

(3) සිංහල, දෙමළ, හෝ ඉංග්‍රීසි කණිෂ්ඨ පාඨශාලා සහතිකය සමත් විය යුතුය.

(4) සංගීතය පිළිබඳ දැනීමක් හෝ තූයඹීවාදන හැකියාවක් තිබීම.

(5) හොඳ චරිතයකින් යුක්ත විය යුතුයි (චරිත සහතික පත් 2 ක් ඉදිරිපත් කළ යුතුයි.

(6) පහත සඳහන් ශාරීරික අවශ්‍යතාවයන් සපුරාලිය යුතුයි :—

(i) උස අඩි 5 අඟල් 2 යි.

(ii) පපුව අඟල් 30යි (ප්‍රශ්වාස කළ විට).

3. මේ සඳහා අයදුම්පත් පහත සඳහන් ආකෘති පත්‍රයේ ප්‍රකාර, ඉල්ලා ඇති කොන්දේසි සපුරා ලීමට අදාල සහතික පත් පිටපත් සමඟ ලංකා පොලිස් තූයඹීවාදක කණ්ඩායමේ සභාපති වෙත 1970.11.2 දිනට පෙර ලැබෙන සේ එවන්න. එවන ලද කඩදාසි ආපසු දෙනු නොලැබේ. මෙදිනට පසු එවන අයදුම් පත් ද භාරගනු නොලැබේ. සියළුම අයදුම්කරුවන් ඔවුන්ගේ වියදමෙන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කොළඹට ඒම අවශ්‍යය. සම්මුඛ පරීක්ෂණයේදී එවන ලද සහතික පත් පිටපත්වල මූලික පත් රැගෙන ඒම අවශ්‍යය.

**සැ. යු.**—අයදුම්කරුවන් අතර සංගීතය කෙරෙහි විශේෂ දක්ෂතාව යක් ඇති අය වුවහොත් පොදු කොන්දේසි කෙරෙහි ඇතිවන යම් යම් සුළු අඩුලුහුඩු තාවයක් වෙතොත් මේ ගැන ද පොලිස් තූයඹීවාදක කණ්ඩායමේ සභාපති විසින් විශේෂයෙන් සළකා බලනු ලැබේ.

සභාපති,
ලංකා පොලිස් තූයඹීවාදක කණ්ඩායම,
බම්බලපිටිය.

**ඉල්ලුම්පත්‍රය**

**(අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)**

### ආධුනික තුයසීවාදකයින්—ලංකා පොලිස් තුයසී වාදක කණ්ඩායම

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. පියාගේ සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. ළඟම ඇති පොලිස් ස්ථානය :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. සංගීතයේ පිළිබඳ සුදුසුකම් :————.
7. උපන් දිනය හා වයස :————.
8. ලාංකික භාවය පාරම්පරික වශයෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද :————.
9. විවාහකද අවිවාහක ද යන වග :————.
10. වෙනත් ඇති විශේෂ සුදුසුකම් :————.
11. අයදුම්කරු හෝ ඔහුගේ ඥාතීන් කිසිදිනෙක නීති විරෝධී ක්‍රියාවකට චෝදනා ලබා තිබේද ? වැරදිකරු වීද ? යන වග (එසේ නම් විස්තර ලුහුඬින් සඳහන් කරන්න) : ————.

ඉහත සඳහන් විස්තර මගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–29—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පරිපාලන අභ්‍යාස ආයතනය

**රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය—1971**

පරිපාලන අභ්‍යාස ආයතනය මගින් පවත්වනු ලබන රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය සඳහා වූ පස්වැනි පාඨමාලාව 1971 පෙබරවාරි මාසයේ දී ආරම්භ වනු ඇත. පාඨමාලාවට අභ්‍යාසලාභීන් තෝරීම සඳහා රජයේ ගණකාධිකාරී සේවයෙහි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් 70. 12. 31 වෙනි දිනට වයස අවුරුදු 49ට අඩු විය යුතුය.

2. අභ්‍යාස පාඨමාලාවෙහි විස්තර පහත දක්වෙයි :—

(i) රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය කොටස් දෙකකින් සමන්විත වෙයි. පාඨමාලාවෙහි පළමුවන කොටස පස් මසක් ද, දෙවන කොටස සිව් මසක් ද පැවැත්වෙයි.

(ii) දේශනවලට අමතර වශයෙන්, ප්‍රායෝගික පුහුණුව, බැදගත් ස්ථාන නැරඹීමට යාම, ගෙදර වැඩ සහ පරීක්ෂණ ද ඇතුළත් වනු ඇත.

(iii) පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පාඨමාලාව පැවැත්වෙන කාලය සඳහා එනම්, නව මාසයකට, සම්පූර්ණ පඩි සහිත නිවාඩු දෙනු ඇත.

(iv) II වන කොටසෙහි පාඨමාලාව හැදෑරීම සඳහා අවසර දීමට පෙර අභ්‍යාසලාභීන් I වන කොටසෙහි සියළුම විෂයයන් ගෙන් සමත් විය යුතුය. I වන කොටසෙහි හෝ II වන කොටසෙහි විභාගය සඳහා දෙවරකට වැඩියෙන් පෙනී සිටීමට කිසිම අපේක්ෂකයකුට අවසර නොදෙනු ඇත.

(v) පාඨමාලාව පැවැත්වෙන කාලය තුළදී, අභ්‍යාසලාභීන්ගේ ප්‍රගතිය විභාග කර බැලීම සඳහා මාස්පතා පරීක්ෂණ පවත්වනු ඇත. මධ්‍යස්ථ කිරීමේ කමිටුව මගින් තීරණය කරනු ලබන පරිදි, කිසියම් අභ්‍යාසලාභියකු පිට පිටම පරීක්ෂණ දෙකකින් අසමත් වුවහොත් ඔහු පාඨමාලාවෙන් ඉවත් කරනු ඇත.

(vi) පාඨමාලාවේ නිර්දේශ පත්‍රිකාව පහත දැක්වෙයි :—

**I වන කොටස (මාස 5)**

උසස් ගණන් තැබීම
ගණන් පරීක්ෂණය
පිරිවැය ගණන් තැබීම
සාමාන්‍ය වානිජ දැනුම
නීතිය
රාජ්‍ය මුදල් හා ආර්ථික විද්‍යාව
සංඛ්‍යාලේඛන විද්‍යාව

**II වන කොටස (මාස 4)**

රාජ්‍ය මුදල් පරිපාලනය
පරිපාලන ගණන් තැබීම—සාමාන්‍ය
පරිපාලන ගණන් තැබීම—පිරිවැය කිරීම
කාර්යාල පාලනය
පරිපාලනය පිළිබඳ මූලධර්ම හා පුහුණුව

(vii) I වන කොටසෙහි ප්‍රශ්න පත්‍ර 7ක්ද, II වන කොටසෙහි ප්‍රශ්න පත්‍ර 5ක්ද ඇත.

(viii) ඒ ඒ ප්‍රශ්න පත්‍රයෙන් සමර්ථවීමේ වට්ටම සියයට 40ක් හෝ මධ්‍යස්ථ කිරීමේ කමිටුව මගින් තීරණය කරනු ලබන පරිදි වන්නේය. විභාගයෙන් සමත් වීම සඳහා අපේක්ෂකයකු එක එක ප්‍රශ්න පත්‍රයෙන් සමත් වී ප්‍රමාණවත් ඓක්‍යයක් ලබාගත යුතුය.

(ix) පාඨමාලාව සාර්ථක අන්දමින් නිම කළ පසු රාජ්‍ය මුදල් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා උපාධියක් අභ්‍යාසලාභීන්ට ප්‍රදානය කරනු ඇත.

(x) පළමුවන ප්‍රයත්නයේදීම රාජ්‍ය මුදල් පරිපාලනය ඩිප්ලෝමා උපාධිය ලබාගන්නා සෑම නිලධාරියෙකුටම අවුරුදු පහක් යනතුරු රු. 50 ක විශේෂ මාසික දීමනාවක් ගෙවනු ඇත.

(xi) පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සෑම නිලධාරියෙකුම අංකය 627 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ගිවිසුමක් අත්සන් කළ යුතුය.

3. ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස්කොට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අයදුම්පත් 1970.10.28 හෝ ඊට පෙර පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ, 28/10, ලෝංඩන් පෙදෙස, කොළඹ 7 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

පුහුණු කිරීමේ වියදම සඳහා වූ ගාස්තුව ගෙවීමෙන් මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් එවීමට සංස්ථාවලටද පුළුවන. ගාස්තු පිළිබඳ විස්තර පහත අත්සන් කරන අයගෙන් ඉල්ලුම් කොට ලබාගත හැකිය.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ හා
පරිපාලන අභ්‍යාස ආයතනයේ
අධ්‍යක්ෂ.

### රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය—1971

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(පෙළපත් නමට යටින් ඉරක් අඳින්න.)
(2) වයස :————. උපන් දිනය :————.
(3) දෙපාර්තමේන්තුව සහ සම්පූර්ණ ලිපිනය :————.
(4) රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වූ දිනය :————.
(5) දැනට සිටින පන්තියට සහ එම පන්තියට ඇතුල් වූ දිනය : ————.
(6) අධ්‍යාපනික සුදුසුකම් :————.
(7) හැදෑරූ පාඨමාලවන් සහ ලැබූ පුහුණුවීම් ඇතුළු වෙනත් සුදුසුකම් :————.

————,
අත්සන.

දිනය :————.

10–103—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

අංකය : කේ. සී. 8/68.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රජයේ බෙහෙත් ගබඩාව

### පිටි කිරි ප්‍රවාහණය කිරීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ වැල්ලවත්තේ රාම ක්‍රිෂ්ණ පාරේ පිහිටි ගබඩාවේ සිට මරදානේ දුම්රිය බඩු ගබඩාව සහ කොළඹ නගර සභා සීමාව තුළ පිහිටි රෝහල් වෙත පිටිකිරි ප්‍රවාහණය කිරීම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරී විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රු. 100ක තැන්පත් මුදලක් මේ කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. නියමිත ටෙන්ඩර් ෆෝර්මයේ නොමැති මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නො ලැබේ.

ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ෆෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම් මට දැන්විය යුතුයි.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—මසකට ප්‍රවාහණය කළ යුතු පිටි කිරි ප්‍රමාණය දළ වශයෙන් රාත්තල් 2,00,000 කි.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " අධිකාරී, රජයේ බෙහෙත් ගබඩාව, කොළඹ " කියා එවිය යුතුයි. සීල් කරනලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්/ගණකාධිකාරී මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—1970 ඔක්තෝබර් මස 24 වනදා පෙ.ව. 10 ට මෙම කාර්යාලයේදි ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළිවෙල කර ගැනීමට හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වෙන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරනලද ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නේ, එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—වෙනත් විස්තර කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී වෙතින් ඉල්ලුම් පත්‍රයක් මගින් ලබා ගත හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
අධිකාරී, රජයේ බෙහෙත් ගබඩාව.

රජයේ බෙහෙත් ගබඩාව,
355, ඩීන්ස් පාර,
කොළඹ 10,
1970 සැප්තැම්බර් මස 24 දින දීය.

10–52—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

මෙරට ගබඩාවන්හී ඇති හානිවූ පිටි අපනයනය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. කොළඹ සහ ත්‍රිකුණාමලය යන ස්ථානයන්හී ගබඩාවල සහ වාප්පුවේ සිට වෙන වෙනම මිළ ගණන් දැක්විය යුතුය.

2. විදේශයෙහි සිටින ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් ස්ථිර ඉල්ලීම් තිබෙන බව ඔප්පු කිරීමට හැකි මිළ ගණනක් ටෙන්ඩර් කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය. පිටි නැවත සකස් කිරීම, නැවත පිරවීම ආදිය අවශ්‍ය වුවහොත්, මිළදී ගන්නෙකු විසින් ප්‍රස්ථාවයේ හැටියට, එය කොළඹ හෝ ත්‍රිකුණාමලයේ දෙපාර්තමේන්තු ගබඩාවලදී හෝ කොළඹ වාප්පුවේදී කළ යුතුය. කොළඹ සහ නගරාසන්න පෙදෙසක ගබඩාවල සිට කොළඹ වරායේ ගුදම කට ප්‍රවාහනය කිරීමේ ගාස්තු පමණක් මෙන්ම කොළඹ සහ ත්‍රිකුණාමලය යන ස්ථාන දෙකේම තීරුබදු ගාස්තු දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබේ. මිළදී ගන්නාට වි. වි. හි සහතික නිකුත් කරනු නොලැබේ. ණයවර ලිපි ආහාර කොමසාරිස්ගේ නමින් විවෘත කළ යුතු අතර නෞභාර පත්‍රය සහ ඉන්වොයිසිය ඉදිරිපත් කල විට ගෙවීම් ලැබිය යුතුය.

3. වාමස් ධාන්‍යාගාරයේ සහකාර ආහාර පාලක හෝ ත්‍රිකුණාමලයේ නියෝජ්‍ය ආහාර පාලක සමග කලින් කටයුතු පිළියෙල කර ගැනීමෙන්, හානිවූ පිටි තොග පරීක්ෂා කර බලා, අවශ්‍ය නම් සැම්පල් ද ලබාගත හැකිය.

4. ටෙන්ඩර් පිටපත් දෙකකින් සමන්විත යුතු අතර ඒවා කවරයක බහා සීල් තබා එම ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ " හානිවූ පිටි අපනයනය සඳහා ටෙන්ඩර් " යන්න ලියා, 1970 ඔක්තෝබර් 23 වෙනි දින පස්වරු 2 ඉක්මෙන්නට ප්‍රථම ආහාර කොමසාරිස්ට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ආහාර කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ආහාර කොමසාරිස් කාර්යාලයේදී 1970 ඔක්තෝබර් 23 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරනු

ලැබේ. ටෙන්ඩර්කරුට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ.

5. වෙනම ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමැත. කෙසේ වෙතත්, රු. 250 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා ලැබුණු කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. තවදුරටත් අවශ්‍ය වැඩි විස්තර පහත අත්සන යොදා ඇති අයගෙන් ලබාගත හැකිය.

6. කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ සම්පූර්ණ අයිතිය ආහාර කොමසාරිස් සතුය.

7. මීට ප්‍රථම කළ දැන්වීමට අනුව දැනට ලැබී ඇති ටෙන්ඩර් සියල්ලම මෙයින් අවලංගු කරනු ලැබේ.

සී. ඊ. එච්. අමරසේකර,
ආහාර කොමසාරිස්.

1970 සැප්තැම්බර් 21 වෙනි දින,
කොළඹ, යූනියන් පෙදෙසේ,
අංක 330 දරණ ස්ථානයේදී ය.

10–50—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ 7, හෝර්ටන් පෙදෙසෙහි අංක 60 දරන ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් "මැලවයිට් ග්‍රීන්" නමැති පාටකුඩු හොණ්ඩර 75 ක් සැපයීම සඳහා පිළිගත් නිෂ්පාදකයන්ගෙන්, ආනයන නියෝජිතවරුන්ගෙන් හා ලංකාවේ ව්‍යාපාරිකයින්ගෙන් ද කැඳවනු ලබන ටෙන්ඩර් 1970 ඔක්තෝබර් මස 24 වැනි සෙනසුරාදා පූ. භා. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරී තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් එම කාර්යාලයේ නි. මි. යෝ. ක්‍ර. හා වී. කෙ. අංශයට ඉදිරිපත් කර 1970 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා දවල් 12 ට හෝ ඊට පෙර නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනු පිටපත ද සහිතව පුරවා එවිය යුතුය.

3 ටැන්ඩර්කරුවන් විසින් සපයනු ලබන "මැලවයිට් ග්‍රීන්" පාට කුඩු ඇතුලත් සැම්පල් සීල් තබා ටැන්ඩර් අවසාන දිනට හෝ ඊට පෙර අංක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ලැබීමට සැලැස්විය යුතුයි. සැම්පල් නොමැතිව ඉදිරිපත් කරන මිළ ගණන් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

4. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වියුනිසියා ගබඩාවේ ගණකාධිකාරී තැනගෙන් ද විමසා දැනගත හැක.

සී. වී. උනම්බුව,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

අංක 60, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7,
1970 සැප්තැම්බර් 25 දින.

10–110—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

### හිස් භාණ්ඩ සහ ඇමඳූ පිටිකිරි විකිණීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම

පහත දක්වා තිබෙන ද්‍රව්‍යයන් පොලොන්නරුවේ උකුකිරි කර්මාන්ත ශාලාවෙන් මිළදී ගෙන එම ස්ථානයෙන් ඒවා ඉවත් කරගෙන යාම පිණිස 1970 ඔක්තෝබර් මස 23 වැනි දින පස්වරු 2 දක්වා මවිසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

#### විස්තර

(1) රාත්තල් 112 ක් ඇඟිරිය හැකි කඩදාසි හය පටකින් යුත් හිස් සීනි බෑග්

(2) රාත්තල් 56 ක් ඇඟිරිය හැකි බහුපට හිස් පිටිකිරි බෑග්

(3) රාත්තල් 56 ක් ඇඟිරිය හැකි හිස් පොලිතීන් බෑග්

(4) බටර් තෙල් ගෙන්වනු ලබන ගැලුම් 45 හේ හිස් පීප්ප

(5) හිස් ලී පෙට්ටි

(6) පළුදු වී තිබෙන හිස් උකුකිරි ටින්

(7) වැනේ පටි

(8) අතුගා එකතු කරන ලද යොදය රහිත පිටිකිරි.

ඉහත සඳහන් ද්‍රව්‍ය පොලොන්නරුවේ උකුකිරි කර්මාන්ත ශාලාවේදී හෝ රාගම, වැලිසර (මීගමු පාරේ 8 වැනි සැතපුම් කණුව අසල) පිටිකිරි යෝජනා ක්‍රමයේ දී සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුල පරීක්ෂාකල හැකි වේ.

නැවත් ආපසු ගෙවනු ලබන රුපියල් 250 ක තැන්පත් මුදලක් හා ආපසු ගෙවනු නොලබන රුපියල් 25 ක ටෙන්ඩර් ගාස්තුවක් තබන අයදුම්කරුවන්ට රාගම, වැලිසර, කිරි මණ්ඩලයේ පිටිකිරි යෝජනා ක්‍රමයේ ගණකාධිකාරී විසින් 1970 ඔක්තෝබර් මස 21 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට කිරි මණ්ඩලීය කාර්යාලයේ සැපයුම් කළමනාකරුගෙන් ලබා ගත හැක.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එලිබෑන්ක් පාර,
කොළඹ 5,
1970 සැප්තැම්බර් මස 24 වැනි දින.

10–190—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

**අශ්වබල 5½ " ඩයියා " ඇන්ජින් සවිකර ඇති " නිපොන් මාරු " හා " ලංකා මාරු " නමැති බෝට්ටු විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

අ. බ. 5½ " ඩයියා " ඇන්ජින් සවිකර ඇති " නිපොන් මාරු " හා " ලංකා මාරු " නමැති බෝට්ටු දෙක විකිණීම සඳහා, කොළඹ 3, ගාලු මුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි හා වැඩි විස්තර 70. 10. 16 වැනි දින දහවල් 12 දක්වා පහත අත්සන් කර ඇති අය වෙතින් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 70. 10. 23 වැනි දින දහවල් 12 ට අවසන් කරනු ලැබේ.

එක් බෝට්ටුවක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල රු. 150 කි.

" නිපොන් මාරු " බෝට්ටුව මීගමුවේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ දී ද, " ලංකා මාරු " බෝට්ටුව මීගමුව, තලාදූවේ, ජෝශප් පීටර් ප්‍රනාන්දු බෝට්ටු අංගනයේදී ද පරීක්ෂා කර බැලිය හැකිය.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ.
25.9.70.

ධීවර අධ්‍යක්ෂ.

10–186—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදුලි බල මණ්ඩලය

**මෙරට සාදන ලද සිලින් පංකා, මේස පංකා සහ ලාම්පු ආවරණ සපයා භාරදීම**

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1970 ක්වූ නොවැම්බර් මස 7 වන සෙනසුරාදා පූ. භා. 10 දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, ලංකා විදුලිබල මණ්ඩලයේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වර්ෂ 1970 ක්වූ නොවැම්බර් මස 3 වන දින ප. ව. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1970 ක්වූ නොවැම්බර් මස 7 වන සෙනසුරාදා පූ. භා. 10 ට කොළඹ, ශ්‍රී චින්තම්පලම් ගාඩිනර් මාවතේ ලංකා විදුලිබල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැනගේ කාර්යාලයේහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඩබ්ලිව්. ඊ. ද ආබෲ,
ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1970 ක්වූ ඔක්තෝබර් 2 වෙනි දින දී ය.

10–162—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

තනි කාණුවේ කොන්ක්‍රීට් නළ 50,000 ක් සැපයීම සහ ගෙනවුත් භාරදීම සඳහා කොළඹ 1, තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 6 වෙනි මහලේ පාලන අංශයේ තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1970 ඔක්තෝබර් මස 21 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත් පෝර්මවලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමට ද, අවශ්‍ය විස්තර දැනගැනීමට ද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කායර්‍යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 200 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 ඔක්තෝබර් මස 18 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවනට, ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගත හැකිවේ.

වී. ඈම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පාලන අංශය, 6 වෙනි මහළ,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොටුව,
කොළඹ.

10–97—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය භෝජනාගාර සහ ආහාර සැපයීමේ සේවයට වෙළඳ ද්‍රව්‍ය සැපයීම සඳහා එවනු ලබන මිළ ගණන් පත්‍ර කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී (තැ. පෙ. 1347) විසින් 1970.10.16 දින පස්වරු 2.30 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත්, ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ සතුටුදායක ලෙස ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාල වන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ කොටුවේ දුම්රිය ස්ථානයේ, දුම්රිය භෝජනාගාර සහ ආහාර සැපයීමේ සේවයේ කළමනාකාරතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල මිළ ගණන් පත් එවිය යුතුය.

4. 1970.10.15 දින ප. ව. 12 තෙක් දුම්රිය භෝජනාගාර සහ ආහාර සැපයීමේ සේවයේ කළමනාකරු විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

5. 1970.10.16 දින ප. ව. 2.30 ට මිළ ගණන් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

අවශ්‍ය වැඩි විස්තර කොළඹ කොටුවේ දුම්රිය භෝජනාගාර සහ ආහාර සැපයීමේ සේවයේ කළමනාකාරතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඈම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1970.9.24 වන දින,
කොළඹ දීය.

10–96—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ඒවා ඉදිරියෙන් දී ඇති දිනයන්හි පෙරවරු 10 වනු තෙක් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත් මාර්ගයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

පෙල්ට් රවුම් 200 ක් සඳහා—1970.11.18

රුමින් මික්චර්ස් ටොන් 375 ක් සඳහා—1970.11.23

එක සැපයීමක් සඳහා රු. 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් පෝරම් කොළ ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසාන වන දිනයන්ට පෙර දහවල් 12 න් පසු බාරගනු නොලබන අතර, ටෙන්ඩර් පෝරම් කොළ ටෙන්ඩරය අවසන් වන දිනදී නිකුත් කරනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රුපියල් 5 ගෙවීමෙන් ලබාගත හැක.

මිලට ගැනුම් කළමණාකාර.

ලංකා රාජ්‍ය ලෝහ සංස්ථාව,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

10–71—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 400 ක් ප්‍රත්තලමට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1970 ඔක්තෝබර් 16 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන.
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ.
70.9.24 වැනි දින.

10–152—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව—අනුරාධපුරය

### 1970/71 මුදල් වර්ෂය ඇතුලත උතුරු මැද අධ්‍යාපන ප්‍රදේශයේ පාසල්වලට "ඇදිහැස" බිස්කෝතු ප්‍රවාහනය කිරීම

පහත දැක්වෙන සැපයීමේ මධ්‍යස්ථානවල සිට එහි දැක්වෙන මණ්ඩලවලට (ඡන්ද කොට්ඨාශ අනුව) අයත් සියලුම පාසල්වලට 19″ × 11″ × 9″ ප්‍රමාණයේ කාඩ් බෝඩ් පෙට්ටිවල රු. 20 බැගින් අසුරන ලද "ඇදිහැස" බිස්කෝතු ප්‍රවාහනය කිරීම.

| සැපයීමේ මධ්‍යස්ථානය | | මණ්ඩලය |
|---|---|---|
| අනුරාධපුර | ... | අනුරාධපුර |
| | | මැදවච්චිය |
| | | හොරොව්පොතාන |
| | | මිහින්තලේ |
| | | කලාවැව |
| | | කැකිරාව |
| පොළොන්නරුව | ... | පොළොන්නරුව |
| | | මින්නේරිය. |

2. ඉහත සඳහන් එක් එක් මණ්ඩලය සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. බිස්කෝතු ප්‍රවාහණය පිළිබඳ ටෙන්ඩර් පත් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1970 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. එදිනම පෙ. ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ටෙන්ඩර්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ඇත. අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රුපියල් 100 ක තැන්පත් මුදලක් එක් එක් සැපයීම් මධ්‍යස්ථානය වෙනුවෙන් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයයේ ගණකාධිකාරී වෙත හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට 1970 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය.

4. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් උතුරු මැද ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රු. 10,000 ක් වටිනා ස්ථිර දේපොල ඇති බවට ඒත්තු යන පරිදි ප්‍රදේශයේ ආදායම් නිලධාරී තුමාගෙන් මෑතක දී ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. බිස්කෝතු ප්‍රවාහනය කිරීමට අදහස් කරන මණ්ඩල ගණන දෙකකට වැඩි නම් ආවරණ සහිත ලොරි දෙකක් ද, මණ්ඩල ගණන දෙකකට අඩුනම් ආවරණ සහිත එක් ලොරියක් ද ඉල්ලුම්කරුට තිබිය යුතුය. එකී වාහන ඉල්ලුම්කරුගේ නමින්, 1970 වර්ෂයට ලියා පදිංචි කරන ලද බවට, බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමූපකාර, ග්‍රාම සංවර්ධන, කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් කිරීමට කලින්, උතුරු මැද ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමූපකාර සංවර්ධන උප කොමසාරිස් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වරයාගෙන් හෝ කම්කරු කොමසාරිස් වරයාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නො ලැබේ.

5. උතුරු මැද ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් හෝ "ඇදිහැස" සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම්පත් ලැබී සතියක් ඇතුලත පාසල් වලට බිස්කෝතු ගෙන ගොස් භාරදීම කළ යුතු වේ. ටෙන්ඩරය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් හෝ භාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයන් ඔවුන ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩරය පිළිබඳ සියලුම කොන්දේසි හා වෙනත් විස්තර උතුරු මැද ප්‍රදේශයේ අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු,
උතුරු මැද ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 23 වැනි දින,
අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

10–90—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කොළ/මාබිම විද්‍යාකර මහා විද්‍යාලය | පන්තිකාමර ගොඩනැගිල්ලක් තැනීම |
| 2. කොළ/දරණගම මහා විද්‍යාලය | පන්තිකාමර ගොඩනැගිල්ල සහ වැසිකිළි හා කැසිකිළි |
| 3. කොළ/ දරණාගම මහා විද්‍යාලය | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 4. කොළ/එල්ලක්කල මහා විද්‍යාලය | ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම |

සංලක්ෂ්‍යය.—කොළ=කොළඹ උතුර දිස්ත්‍රික්කය.

2 කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ එක් වැඩක් සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය ගම්පහ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ඔක්තෝබර් මස 21 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

අවශ්‍ය ලියාපදිංචිය :

අංක 1 සඳහා රු. 31,000 හෝ ඊට වැඩි ගණනකට
අංක 2 සඳහා රු. 28,000 හෝ ඊට වැඩි ගණනකට
අංක 3 සඳහා රු. 18,000 හෝ ඊට වැඩි ගණනකට
අංක 4 සඳහා රු. 5,000 හෝ ඊට වැඩි ගණනකට.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා පෙ. ව. 10.30ට ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගම්පහ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාශය මඟින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඊ. වී. අබේසේකර,
ගම්පහ ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 23 වැනි දින,
ගම්පහ අධ්‍යාපන කාර්යාලයේදීය.

10–134—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ පිහිටි රබර් ඉඩමේ අමු රබර් කිරි මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම— 1970-71

ඉහත සඳහන් නිෂ්පාදන ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරී විසින් 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

2. මුද්‍රිත ටෙන්ඩර් පත් නොමැත. මුද්‍රා තබන ලද කවරයේ වම් කෙළවර "අමු රබර් කිරි සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ආයතනයෙහි ප්‍රධාන දොරටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

3. 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.35 ට අධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටිය හැක.

4. රුපියල් 10 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කොට ඊට ලබා ගන්නා රිසිට්පත ටෙන්ඩර් පත සමග අමුණා එවිය යුතුයි. මිල ගණන් සඳහන් කිරීමේදී එය අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් කළ යුතුවේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු විසින් රුපියල් 50 ක ඇප මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ටෙන්ඩර්කරු විසින් සපයා ඇති ලිපිනයට තැපැල් කළහොත් හෝ ගෙනැවිත් දුනහොත් එය ඔහුට ලැබුනු බව සලකනු ලැබේ.

6. පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කිරි මිළදී ගැනීම අත්හිටවුව හොත් ඔහුගේ ඇප මුදලවූ රුපියල් 50 රාජසන්තක කරනු ලැබේ.

7. කිරි කපන දින වලදී දිනකට රබර් කිරි රාත්තල් 40 වත්, 50 වත් අතර ප්‍රමාණයක් සැපයිය හැක. ටෙන්ඩර්කරු විසින් සපයන ලද භාජන වලට ආයතනයේ ප්‍රධාන දොරටුවේදී එම කිරි කිරා සපයනු ලැබේ. එදිනෙදා සපයන ලද රබර් කිරිවල නියමිත වටිනාකම ඒ අවස්ථාවේදීම ගෙවිය යුතුයි.

8. වැඩිදුර විස්තර පහත අත්සන් තබා ඇති අයගෙන් දැන විමසා ගත හැක.

ඊ. සී. ප්‍රේමතිලක,
අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය,
වතුපිටිවල.

1970. 9. 15 වෙනි දින.

10–26/2—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි උපකරණ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් කැඳවීම— 1970-71

වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයේ අධිකාරී විසින් පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සඳහා 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

1. දිග අඩි 6×පළල අඩි 1½ දෙඉරු පොල්අතු 100 ක් ගෙනැවිත් භාරදීම සඳහා.
2. 8 3/4"×4 3/16"×2 5/8" පිළිස්සූ ගඩොල් 1,000 ක් ගෙනැවිත් භාරදීම සඳහා.
3. අපවිත්‍ර දෑ වලින් තොර ගඟේ වැලි කියුබ් 1 ක් ගෙනැවිත් භාර දීම සඳහා.
4. 3/4" කළුගල් කියුබ් 1 ක් ගෙනැවිත් භාර දීම සඳහා.
5. 6"×9" සක්ක කළුගල් කියුබ් 1 ක් ගෙනැවිත් භාර දීම සඳහා.

මේ සඳහා මුද්‍රිත ටෙන්ඩර් පත් නොමැත. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ, "ගොඩනැගිලි උපකරණ" යනුවෙන් සඳහන් කළ යුතුවේ. තැපැලෙන් නොඑන ටෙන්ඩර් පත් ආයතනයේ දොරටුවේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

2. ටෙන්ඩර්කරු විසින් මිළ ගණන් සඳහන් කිරීමේදී එම මුදල අකුරින් හා ඉලක්කමෙන් සඳහන් කළ යුතුයි. ද්‍රව්‍යයන් වෙනුවෙන් මිළ ගණන් සඳහන් කිරීමේදී ආයතනය තුලටම ගෙනැවිත් භාර දීමේ ප්‍රවාහණ ගාස්තු සමග මිළ ගණන් වෙන වෙනම සඳහන් කළ යුතුයි.

3. 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.40 ට ටෙන්ඩර් පත් අධිකාරි කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමේ බලය ඇත.

4. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් රුපියල් 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුවේ. සතියක් තුලදී ගොඩනැගිලි උපකරණ සැපයීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් තබන ලද ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

5. වැඩිදුර විස්තර පහත අත්සන් තබන අයගෙන් දැන විමසා ගතහැක.

ඊ. සී. ප්‍රේමතිලක,
අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය,
වතුපිටිවල.

1970. 9. 15 වෙනි දින.

10–26/3—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේ ඇති හිස් ගෝනි, පරන ප්‍රවෘත්ති පත්‍ර සහ හිස් සත්ව ආහාර උර ආදිය මිළදී ගැනිම**

පහත සඳහන් ද්‍රව්‍යයන් මිළදී ගැනීම සඳහා වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේ අධිකාරි විසින් ටෙන්ඩර් පත් 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.30 දක්වා භාර ගනු ලැබේ :—

1. හිස් සත්ව ආහාර උර 1,325
2. හිස් පිටි ගෝනි 600
3. හිස් ගෝනි (විවිධ වර්ගයේ) 400
4. හිස් හාල් ගෝනි 200
5. හිස් සීනි ගෝනි 50
6. පරන ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් 200
7. කැපී අපතේ ගිය ගැලෝනයිස් තහඩු කැලි රාත්තල් 600
8. ගැලුම් හතරේ (4) හිස් ටිං 50

මෙම ද්‍රව්‍යයන් සතියේ දිනවල පෙ. ව. 8 සිට පෙ. ව. 11.30 දක්වාත් ප. ව. 1 සිට ප. ව. 4 දක්වාත් පරීක්ෂා කළ හැක.

2. මෙම කාර්යාලයේ රුපියල් 10 ක තැන්පත් මුදලක් තබා එයට ලබා ගන්නා රිසිට්පත අනුපිටපතකින් යුක්ත ටෙන්ඩර් පතේ අමුණා එවිය යුතුය. තමාගේ ටෙන්ඩරය භාරගත් බව ලිපියකින් දන්වා දින 7 ක් ඇතුලත ද්‍රව්‍යයන්වල නියම මිළ ගණන් ගෙවා එම ද්‍රව්‍යයන් ගෙන යාමට නොහැකි බව හෝ අකමැත්තක් දක්වන අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට තැපැල් කළහොත් හෝ ගෙනැවිත් දුනහොත් එය ඔහුට ලැබුණු බව සලකනු ලැබේ. භාරගත් ටෙන්ඩර්කරු විසින් එම ද්‍රව්‍යයන් ගෙන යාමෙන් පසුව තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර්කරු විසින් හිස් ගෝනි එකක, හිස් ටිං එකක, ප්‍රවෘත්ති පත්‍ර රාත්තලක, සත්ව ආහාර උර එකක මිළ ගණන් වෙන වෙනම යනාදී වශයෙන් ඉහත සඳහන් ද්‍රව්‍යයන්ට මිළ ගණන් සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එවීමේදී මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එසේ එවීමේදී ලියුම් කවරයේ වම් කෙළවර මුදුනත පරණ ගෝනි වෙනුවෙන් සඳහන් කළ යුතුය. තැපැල් මගින් නොඑවන ටෙන්ඩර් පත් ආයතනයේ ප්‍රධාන දොරටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

4. 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින පෙ. ව. 10.30 ට මෙම ආයතනයේ අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමේ බලය ඇත.

5. වැඩිදුර විස්තර පහත අත්සන් තබන අයගෙන් විමසා දැන ගත හැක.

ඊ. සී. ප්‍රේමතිලක,
අධිකාරී,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය,
වතුපිටිවල.

1970. 9. 15 වෙනි දින.

10–26/4—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

**කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970.11.1 සිට 1971.9.30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උප ලේඛණයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත් කොළඹ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී, සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛණයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායර්‍ාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කායර්‍ාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්ම යේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙණෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උප ලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ''කියා එවියයුතුයි සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළයුතුවාත් මෙන්ම එහි වම්පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උප ලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙණෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාවත් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස $4\frac{1}{2}$ ක් ඇතුලත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දැක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛණයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස්කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍යවනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිළ ශත 50 කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පියීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරගනු ලැබේ.

(iv) කූපන්හාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් හාරදුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩුකරගනු ලැබේ.

වෛද්‍ය එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි.

1970.9.20.

ලේඛණය 1970/71

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල<br>රු. | 3<br>ඇප මුදල<br>රු. | 4<br>ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | 5 ආහාර ප්‍රමාණය දළ වශයෙන් — ලෙඩුන්ට<br>මාලු | ලෙඩුන්ට<br>මස් | ලෙඩුන්ට<br>කරවල | ලෙඩුන්ට<br>එළවළු | නොගෙවන රෝගීන්ට<br>මාළු | නොගෙවන රෝගීන්ට<br>මස් | නොගෙවන රෝගීන්ට<br>කරවල | නොගෙවන රෝගීන්ට<br>එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ජාඇල ග්‍රාමීය රෝහල ... | 100 ... | 400 ... | ... | 150... | 150... | 150... | 600... | 300... | 300... | 300... | 1,300 |
| 2. කැළණිය ග්‍රාමීය රෝහල ... | 100 ... | 800 | 1970.10.18 දින පෙ.ව. 10 | 300... | 300... | 300... | 1,200... | 600... | 600... | 600... | 2,400 |
| 3. නවගමුව ග්‍රාමීය රෝහල ... | 100 ... | 400 | | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50... | 150 |
| 4. අතුරුගිරිය ග්‍රාමීය රෝහල ... | 100 ... | 400 | | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50... | 50 |

10–108—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ නිවාස යෝජනා ක්‍රමය— ජීවන නිවාස තැනීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි උපකරණ සැපයීම**

පූර්වෝක්ත නිවාස තැනීම සඳහා විශාල ප්‍රමාණයක ගොඩනැගිලි උපකරණ අවශ්‍ය වී ඇත. කටුනායක, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කටුනායක ගුවන් තොටුපල සංවර්ධන ක්‍රමයේ, ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් පමණක් ඒ ඒ අවස්ථාවන්හි ලබා ගන්නා ලද මිළ ගණන් අනුව උපකරණ සපයා ගනු ලැබේ.

2. ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති අය විසින් ස්වකීය ඉල්ලුම්පත් 1970 ඔක්තෝබර් මස 26 වැනි සඳුදා දහවල් 12 ට පෙර කටුනායක, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කටුනායක ගුවන් තොටුපල සංවර්ධන ක්‍රමයේ, ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ලේඛනගත තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුයි. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ නිවාස යෝජනා ක්‍රමය—උපකරණ සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත් සමග පහත දැක්වෙන විස්තර සැපයිය යුතුය :—

(අ) ඉල්ලුම්කරුට සැපයිය හැකි උපකරණ දැක්වෙන ලැයිස්තුව.

(ආ) ලොරි, ටිපර්, ට්‍රේලර් සමග ට්‍රැක්ටර් වැනි තමන් සතු වාහන වල ලියාපදිංචි කිරීමේ අංක දැක්වෙන ලැයිස්තුවක්. එක් එක් වාහන මේ අවුරුද්ද සඳහා ලියාපදිංචි කොට සහ රක්ෂණ කොට තිබේදැයි සඳහන් කළ යුතුය.

(ඇ) මෙවැනි සැපයීම් වැඩ කොට ලත් පළපුරුද්ද සනාථ කිරීමේ ලිඛිත සාධක.

3. අවශ්‍ය වී තිබෙන උපකරණ පහත සඳහන් වේ :—

(1) අඟල් $\frac{3}{4}$ කළුගල්
(2) අඟල් 1 කළුගල්
(3) අඟල් $\frac{1}{2}$ කළුගල්
(4) අඟල් 2 කළුගල්
(5) 6"—9" සක්කගල්
(6) ගඩොල්
(7) ගංගා වැලි ,,
(8) අළුහුණු සහ පුච්චාපු හුණු
(9) රවුම් ලී කණු
(10) පලංචි සඳහා උණ බම්බු
(11) පොල් අතු

එස්. නාගලිංගම්,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු,
කටුනායක ගුවන් තොටුපල සංවර්ධන ක්‍රමය.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක, 1970.9.24.

10–131—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා පහත සඳහන් සැපයීම් සේවා සහ නිළ ඇඳුම් හා බැරැක්ක රෙදි පිළි සේදීම සඳහා කොළඹ 1, තැ. පෙ. 593, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදාවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඒ ඒ සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | I<br>සැපයීම් සේවා | II<br>ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අන්තිම දිනය | III<br>ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය | IV<br>ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කිරීම |
|---|---|---|---|---|
| (අ) | රාජකීය ලංකා නාවික හමුදාවේ, කල්පිටිය නාවික කඳවුරට, පොල්, එළවළු, කිරි පට්ටි නිෂ්පාදන, මස්, අළුත් මාළු සහ උදය ආහාර ද්‍රව්‍ය වර්ගද, සැපයීම | දවල් 12<br>18.10.1970 | ... පෙ ව. 10<br>... 20.10.1970 | ... පෙව. 10.30<br>... 20.10.1970 |
| (ආ) | නිල ඇඳුම් සහ බැරැක්ක රෙදි පිළි සේදීම | ... දවල් 12<br>18.10.1970 | ... පෙ.ව. 10<br>20.10.1970 | ... පෙ.ව. 10.30<br>... 20.10.1970 |

2. අයදුම්කරුගේ මුදල් තත්වය සහ මෙම සැපයීම් සහ සේවා කරගෙන යෑමේ හැකියාව පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුමක් මත, ඉහත සඳහන් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත් ඒ ඒ සැපයීම ඉදිරියෙහි II තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12 දක්වා කොළඹ, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ නාවික හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් එක් එක් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට මත්තෙන් රු. 75/-බැගින්, නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් නාවික හමුදා මූලස්ථානයේදී ගෙවිය යුතුයි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරුවන් තම තමන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනය ඉදිරිපත් කලයුතුයි.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරුවන්, තමන් ටෙන්ඩර් කිරීමට කැමති ඒ ඒ සැපයීම සඳහන් කිරීම අවශ්‍යය. ඉහත සඳහන් ''අ'' සහ ''ආ'' පිළිබඳ සැපයීම් සහ සේවා සඳහා වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

ඩී. වී. හන්ටර්,
කොමදෝරු,
වැඩබලන නාවික හමුදාධිපති.

නාවික ආහාර හා නිළ ඇඳුම් අංශය,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ 1,
1970 සැප්තැම්බර් මස 24 දින.

10—102—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## තීරණය කළ ටෙන්ඩර්—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුවේ සෞ. සේ. අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම—1970

| ආයතනයේ නම | තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ නම | ලැබුණු ටෙන්ඩර් ගණන | ආහාර වර්ගය සඳහා පිළිගත් මිළ ගණන් — සේවකයින්ට — මාළු රු. ශ. | සේවකයින්ට — කරවල රු. ශ. | සේවකයින්ට — එළවලු රු. ශ. | රෝගීන්ට — මාළු රු. ශ. | රෝගීන්ට — කරවල රු. ශ. | රෝගීන්ට — එළවලු රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| ඒරාවූර් ග්‍රා. රෝහල | ඒ. සිවලිංගම් | 1 | 2 0 | 1 30 | 1 24 | 2 0 | 1 54 | 1 30 |
| පොතුවිල් ග්‍රා. රෝහල | එම්. එම්. ජෝදිදස | 2 | 2 0 | 2 0 | 1 60 | 2 0 | 2 0 | 1 48 |
| අක්කරපත්තු ග්‍රා. රෝහල | ඒ. සිවලිංගම් | 1 | 2 50 | 2 40 | 2 0 | 2 50 | 2 40 | 2 0 |
| කලුවාන්චිකුඩි ග්‍රා. රෝහල | වී. පොන්නම්පලම් | 1 | 2 25 | 2 0 | 1 75 | 2 0 | 1 75 | 1 45 |
| වාකරේ ග්‍රා. රෝහල | වී. වයිරමුත්තු | 1 | 1 75 | 1 50 | 1 40 | 1 65 | 1 35 | 1 30 |
| ලාහුගල මා. නි. | ඒ. සිවලිංගම් | 1 | 2 65 | 2 60 | 2 25 | 2 50 | 2 45 | 2 25 |
| නාවත්කාඩු මා. නි. | ඊච්චන්දීවු ග්‍රා. ස. ස. | 1 | 2 65 | 2 60 | 2 40 | 2 65 | 2 50 | 2 35 |

ටී. සන්මුගනාදන්,
මඩකලපුවේ සෞ. සේ. අධිකාරි.

මඩකලපුවේ සෞ. සේ. අධිකාරි,
කාර්යාලය, 25 සැප්තැම්බර් 1970.

10—41—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ටෙන්ඩර් ප්‍රතිඵල

| සැපයීම් විස්තර | ලද ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළගණන් |
|---|---|---|---|
| (1) ස්වයංධාවන මඩහාරන යාත්‍රාවක් සැපයීම | රටවල් හයකින් (6) ටෙන්ඩර් 12 ක් ලැබී ඇත | සීමාසහිත ඉෂිකාවාජිමා හරිමා-හෙවි ඉන්ඩස්ට්‍රීස්, 2—1, 2 චෝමෙ, ඔටෙන්ජි, චියෝඩා-කු, ටෝකියෝ 100 | ජපන් යෙන්—48,60,00,000 |
| (2) බර්තින් ටග් යාත්‍රාවක් සැපයීම | රටවල් 9 කින් ටෙන්ඩර් 17 ක් ලැබී ඇත | සීමාසහිත තායිහෙයි සමාගම, සේනාරි ගොඩනැගිල්ල, 9 (6) 8, චෝමෙ, ටෝකියෝව 104, ජපානය | ජපන් යෙන්—27,68,25,000 |

ආර්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1970.9.25.

10–132—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

1970 ඔක්තෝබර් මස 16 වෙනි දින පෙ. ව. 10 ට පහත සඳහන් සතුන් වතුපිටිවල තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විදුහලේ ගොවි පොලෙහිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

1. වැඩුනු ඌරන් 1 යි.
2. වැඩුනු ඊරියන් 2 යි.
3. ඌරු පැටවුන් 10 යි.

මෙම සතුන් සතියේ දිනවල පෙ. ව. 8 වත් ප. ව. 4 වත් අතර පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේ ඉල්ලීම සාර්ථක වන ඉල්ලුම් කරුවන් විසින් එහිදී මුදල් ගෙවා වෙන්දේසිය අවසන්වූ විගස එම සතුන් එම ස්ථානයෙන් ඉවත් කරගත යුතුයි.

ජී. සී. ප්‍රේමතිලක,
අධිකාරි,
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය,
වතුපිටිවල.

1970 සැප්තැම්බර් 15 වෙනි දින.

10–26/1—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### පාවිච්චි නොකළ හැකි භාණ්ඩ වෙන්දේසියක්

පාවිච්චි නොකළ හැකි කාර්යාල බඩු හා උපකරණ තොගයක් 1970 ඔක්තෝබර් මස 12 වෙනි දින පෙ. ව. 10 ට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින පෙ. ව. 10 වත් දවල් 12 වත් අතර වෙන්දේසි කිරීමට නියම බඩු පරීක්ෂා කළ හැක.

සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් එහිදී මුදල් ගෙවා වෙන්දේසිය අවසන් වූ විගාම බඩු ඉවත් කරගත යුතුයි.

එල්. ඒ. ඩී. අයි. ඒකනායක,
අධ්‍යක්ෂ,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

1970 සැප්තැම්බර් මස 20 දින,
අංක 383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

10–32—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

### මහේස්ත්‍රාත් උසාවිය—ගම්පහ

මෙතෙක් අයිතිකරුවන් ඉදිරිපත් නොවීම නිසා බොහෝ කලක පටන් උසාවියේ තබා ඇති මෙහි පහත සඳහන් නඩු අංකවලට අයත් නොයෙක් වර්ගයේ පරණ පාපැදි, පාපැදිවල අමතර කොටස්, ප්ලාස්ටික් භාජන, පිජ්ප හා තවත් නොයෙකුත් බඩු 1970 ඔක්තෝබර් මස 28 වෙනි දින ප. ව. 1.00 ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම පාපැදිවලට අයිතිකරුවන් ඇතොත් හෝ යම් පාපැදියක් වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීමට හේතුවක් තිබේ නම් 1970 ඔක්තෝබර් මස 25 වෙනි දිනට ප්‍රථම පිළිගත හැකි සාක්ෂි හෝ ලියකියවිලි සමග උසාවියට ඉදිරිපත් විය යුතුය.

| | නඩු අංකය | | පාපැදි අංකය |
|---|---|---|---|
| 1. | 18755/ඒ. | ... | ... සී. ජී. 2019 |
| 2. | 28767/ඒ. | ... | ... එච්. 08314 |
| 3. | 34234/ඒ. | ... | ... වී. 57 |
| 4. | 34454/බී. | ... | ... සී. එල්. 1511 |
| 5. | 21372/බී. | ... | ... කේ. 92253 |
| 6. | 30131/බී. | ... | ... බී. ඔ. 1272 |
| 7. | 24937/බී. | ... | ... ඩී. ඒ. 90680 |
| 8. | 34337/බී. | ... | ... 53561 |
| 9. | 31240/ඒ. | ... | ... ඩී. ආර්. 228 |
| 10. | 7847/ඒ. | ... | ... අංකය නැත |
| 11. | 26602/ඒ. | ... | ... බී. එච්. 58424 |
| 12. | 31350/ඒ. | ... | ... බී. එන්. 4127 |
| 13. | 29583/ඒ. | ... | ... අංකය නැත (රෑලි වර්ගය) |
| 14. | 32576/ඒ. | ... | ... කේ. 60149 |
| 15. | 32927/ඒ. | ... | ... බී. ටී. 25488 |
| 16. | 39688/ඒ. | ... | ... ඩී. ඊ. 58049 |
| 17. | 38499/ඒ. | ... | ... බී. එම්. 37418 |
| 18. | 25776/බී. | ... | ... ජී. ආර්. 2406 |
| 19. | 24100/ඒ. | ... | ... ඔ. ඊ. 4458 |
| 20. | 23715/ඒ. | ... | ... බී. ජී. 93090 |
| 21. | 28819/බී. | ... | ... වී. ටී. 3290 |
| 22. | ඒ. ආර්. 8084/ඒ. | | ... ඩී. ඉසැඩ්. 1857 |
| 23. | ඒ. ආර්. 8213/ඒ. | | ... ඔ. ජේ. 1192 |
| 24. | 21698/ඒ. | ... | ... බී. ඩී. 43976 |
| 25. | ඒ. ආර්. 6921/බී. | | ... ඩී. ටී. 44363 |
| 26. | එ. ආර්. 6692/ඒ. | | ... 34684 |
| 27. | 15654 | ... | ... ඒ. එෆ්. 2068 |
| 28. | 63137/ඒ. | ... | ... බී. ඔ. 4061 |
| 29. | ඒ. ආර්. 6702 | | ... ඊ. ආර්. 179 |
| 30. | 372/ඒ. | ... | ... ඒ. ඉසැඩ්. 73554 |
| 31. | 1951/66 | ... | ... ඒ. ඒන්. 31528 |
| 32. | 73092 | ... | ... එජ්. එජ්. 46997 |
| 33. | 5494 | ... | ... එන්. 69835 |
| 34. | ඒ. ආර්. 6983/ඒ. | | ... 8959 |
| 35. | ඒ. ආර්. 8368/බී. | | ... ඩී. 95019 |
| 36. | ඒ. ආර්. 8157 | | ... බී. එච්. 62450 |
| 37. | ඒ. ආර්. 8481/70 | | ... සී. ජේ. 35973 |
| 38. | ඒ. ආර්. 8961/70 | | ... එජ්. ඊ. 69502 |
| 39. | ඒ. ආර්. 9026/බී. | | ... ඒ. ඊ. 24332 |

මහේස්ත්‍රාත් උසාවිය,
ගම්පහ,
18.9.70.

මහේස්ත්‍රාත්.

10–7.—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

එම් 1970 ඔක්තෝබර් මස 20 වෙනි දින පෙ. ව. 10 ට මාතර පොලිස් ස්ථානයේදී පහත සඳහන් පාවිච්චියට නුසුදුසු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉංග්‍රීසි යතුරු ලියන 2, පිඩන ලාම්පු 2, පා පැදි 12, රේඩියෝ 6, භූමිතෙල් උදුන් 21, අත් පලඳනා පටි 15, බූට් සපත්තු ජෝඩු 54, පො. රියැදුරු හිස්වැසුම් 6, ගැටිම් ඔරොත්තු දෙන හිස්වැසුම් 3, බුරුසු 26, හම් පටි 16, උන්ඩ උර 12, බොත්තම් මදින තහඩු 4, කැන්වස් සපත්තු ජෝඩු 8, පිස්තෝල කොපු 2, කාකි හට කබා 31, කාකි කැලැකබා 18, කාකි කොට කලිසම් 49, කාකි දිග කලිසම්, 5, නිල ඇඳුම් පලස් 31, කොහු ගුදිරි 59, වෙලුම්පටි ජෝඩු 23, කැප් තොප්පි 3, පතරොම් මලු 2, වැහි කබා 15, වැහිකබා පටි 2, හම් සපත්තු ජෝඩු 277, ඇල තොප්පි 198, නිල් දිග මේස් ජෝඩු 23, සුදු කෝට් 1, සුදු දිග කලිසම් 1, පතරොම් පෙට්ටි 1, අලුත් නිල් දිග මේස් (අබලන්) ජෝඩු 10, පිල්ටර් 1, මේස ලාම්පු 6, ලන්තෑරුම් 1, ඉබ්බෝ 23, මිනුම් පටි 4, නිල ඇඳුම් පෙට්ටි 10.

වෙන්දේසිය අවසන්වූ විගසම මුදල් ගෙවීම සහ බඩු ඉවත්කර ගැනීම කළ යුතුයි.

ඩී. ඩී. කරවිට,
වැ. බ. පොලිස් අධිකාරි,
දකුණු පලාත (නැගෙනහිර) මාතර.

පොලිස් කාර්යාලය,
මාතර.
1970. 9. 16.

10–2—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම්

වවුනියා අඩවියේ ඇති ඝණ අඩි 71.6 යත් පළමුවැනි පංතියේ ඉරූ දැව කෑලි 76 ද, ඝණ අඩි 694.4 යුත් පළමුවැනි පංතියේ කඳන් 73 ද, තේක්ක කණු තුනක් ද, කියත් තුනක් ද, පොරෝ දෙකක් ද, 70.10.15 දින වවුනියා අඩවි වන කාර්යාලයේදී වවුනියා දිසා වන නිලධාරි විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව වෙන්දේසියේ විකිණීමට ප්‍රථම පරීක්ෂා කර බලන ලෙස වෙන්දේසියෙන් දැව ගැනීමට අපේක්ෂා කරන සියලු දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන් කර ඇති අයගෙන් හෝ වවුනියා අඩවි වන නිලධාරිගෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ජේ. ජේ. මේදර්,
දිසා වන නිලධාරි, වවුනියාව,

දිසා වන කාර්යාලය,
වවුනියාව, 1970 සැප්තැම්බර් 16.

10–47—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසිය

මීරිගම අඩවියේ නා නා ස්ථානවල ඇති කොස්, මිල්ල, බැදිදෙල් හා වෙනත් නා නා වර්ගවලට අයත් කඳන් 15 කින් යුත් දැව ඝන අඩි 256.9 ක් ද, ඉරූ මිල්ල ලී කෑලි 9 කින් යුත් දැව ඝන අඩි 4.6 ක් ද වන දැව තොග 7 ක් 1970 ඔක්තෝබර් මස 13 වැනි දින පෙ. ව. 10 ට මීරිගම අඩවි වන කාර්යාලයේදී වයඹ දිසාභාර වන නිලධාරි විසින් ප්‍රසිඬ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා මීරිගම අඩවි වන නිලධාරි හෝ වයඹ දිසා වන නිලධාරි හෝ විමසන්න.

ඊ. සී. ද ඉසෑඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරි,
කුරුණෑගල.

1970 සැප්තැම්බර් 21 දින,
කුරුණෑගල.

10–187—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 7, ග්‍රීන්පාත්, කොළඹ දකුණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කඩන ලද ගොඩනැගිල්ලකින් ඉවත් කළ පරණ ගොඩනැගිලි ද්‍රව්‍ය තොගයක් 1970.10.25 වැනිදා උදේ 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිඬ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසි කිරීමට ඇති ද්‍රව්‍ය මෙහි පහත පළවේ.

**වෙන්දේසිය සම්බන්ධ කොන්දේසි මෙසේ ය :**

(අ) වෙන්දේසියේ විකිණීමට ඇති ද්‍රව්‍ය තොගය ඉහත සඳහන් ස්ථානයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. වෙන්දේසියේ දී ද්‍රව්‍ය තොගය මිළයට ගැනීමට අදහස් කරන ඉල්ලුම්කරුවන් විසින් එම ද්‍රව්‍ය තොගය කලින් පරීක්ෂා කර බලා ඒවායේ තත්ත්වය හා ප්‍රමාණය ද පිළිබඳව සෑහීමට පත්විය යුතුයි. වෙන්දේසියෙන් පසුව ලැබෙන කිසිම පැමිණිල්ලක් පිළිගනු නො ලැබේ.

(ආ) වෙන්දේසිය අවසානයේදී ගැනුම්කරුවා විසින් ද්‍රව්‍යවල වටිනාකම ලෙස තක්සේරු කරනු ලබන මුදල වෙන්දේසිය පවත්වන නිලධාරි මහතාට ඒ වේලාවේදී ම ගෙවා රිසිට් පතක් ලබාගත යුතුයි.

(ඇ) මිළයට ගත් ද්‍රව්‍ය අධ්‍යාපන දෙපාර්තමේන්තු භූමියෙන් ඉවත් කර ගන්නා තුරු ඒවායේ ආරක්ෂාව ගැනුම්කරුවන් සතුය.

(ඈ) ගැනුම්කරුවන් විසින් ද්‍රව්‍ය තොගය ගෙන යා යුත්තේ කාර්යාලයේ ප්‍රධාන ලිපිකාර මහතා ඉදිරිපිටදීය. මේ අවස්ථාවේදී දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලට හෝ වත්තේ වැටිලි ආදියට හෝ කිසියම් හානියක් නොවන ලෙසට ක්‍රියා කළ යුතුයි.

ඩී. ජී. සුගතදාස,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂක.

1970 සැප්තැම්බර් මස 20 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

1. සරනේරු
2. සොයිබ
3. පිඟන් ගඩොල්
4. අඩ රවුම් උළු
5. ගඩොල්
6. කබොක් ගල්
7. ලුනුම්දෙල්ල සිවිලින් ලෑලි
8. පැතලි උළු
9. දොර ජනෙල් පියන් හා රාමු
10. ගැල්වනයිස් වැන්තියන්
11. වැසිකිලි සිස්ටර්න් එකක්
12. පරාල බාල්ක රීප්ප ආදිය.

10–92—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඩෙල්fප්ට් තට්ටුක ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1970 ඔක්තෝබර් මස 16 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 ඔක්තෝබර් මස 15 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/34

1970 සැප්තැම්බර් මස 24 වෙනි දින,

කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. යන්ත්‍රෝපකරණ පෙට්ටි 65 යි.
2. කඩදාසි පෙට්ටි 2 යි.
3. යන්ත්‍රෝපකරණ පෙට්ටි 7 යි.
4. යන්ත්‍රෝපකරණ පෙට්ටි 4 යි.
5. සත්ව ආහාර ඩ්‍රම් 15 යි.
6. සම් මිටි 13 යි.
7. සම් පෙට්ටි 1 යි.
8. යන්ත්‍රෝපකරණ පෙට්ටි 2 යි.
9. ප්‍රචාරක බෝඩ් පෙට්ටි 1 යි.
10. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
11. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
12. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
13. යන්ත්‍රෝපකරණ පෙට්ටි 2 යි.
14. බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
15. මෝටර් ඇන්ජින් අමතර කොටස් පෙට්ටි 2 යි.
16. යන්ත්‍රෝපකරණ පෙට්ටි 2 යි.
17. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
18. සම් පෙට්ටි 1 යි.
19. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
20. කපු රෙදි පෙට්ටි 1 යි.
21. නූල් පෙට්ටි 3 යි.
22. නූල් පෙට්ටි 37 යි.
23. ක්‍රේප් කඩදාසි කාටූන් 58 යි.
24. නූල් රෝල් කාටූන් 32 යි.
25. යන්ත්‍ර කොටස් කාටූන් 37 යි.
26. රත් කිරීමේ දරණු පෙට්ටි 1 යි.
27. 1970 දින දර්ශන පෙට්ටි 1 යි.
28. රේයන් නූල් පෙට්ටි 1 යි.
29. fපයිල් කවර පෙට්ටි 3 යි.
30. කඩදසි මිටි 57 යි.
31. කඩදාසි මිටි 24 යි.
32. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
33. ස්ට්‍රෝබෝඩ් 80 යි.
34. තේ පෙට්ටි

35. කළු නූල්
36. නාන බක්කි පෙට්ටි 2 යි.
37. රසායන ද්‍රව්‍ය මලු 15 යි.
38. රසායන ද්‍රව්‍ය මලු 10 යි.
39. සම් රෙදි පෙට්ටි 1 යි.
40. සම් රෙදි පෙට්ටි 1 යි.
41. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
42. රසායන ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
43. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
44. ටයර් ටියුබ් පෙට්ටි 4 යි.
45. ටයර් ටියුබ් පෙට්ටි 1 යි.
46. ඊම් ලොක්ස් පෙට්ටි 1 යි.
47. මෝටර් රථ දුනුකොළ තොග 1 යි.
48. ටයර් 16 යි.
49. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
50. යන්ත්‍රෝපකරණ පෙට්ටි 2 යි.
51. ටයිමින් චේන්ස් පෙට්ටි 1 යි.
52. හරිකේන් ලාම්පු
53. හරිකේන් ලාම්පු
54. නූල් කාටුන් 11 යි.
55. හෙ.ට් ප්ලේට් පෙට්ටි 1 යි.
56. බෙහෙත් ද්‍රව්‍ය කාටුන් 1 යි.
57. යන්ත්‍රෝපකරණ කාටුන් 1 යි.
58. වෛද්‍ය උපකරණ පෙට්ටි 1 යි.
59. ටයර් 2 යි.
60. ටයර් ටියුබ් කාටුන් 1 යි.
61. මෙටල් fපිලර් කාටුන් 1 යි.
62. සරනේරු පෙට්ටි 4 යි.
63. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
64. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
65. නූල් පන්දු කාටුන් 1 යි.
66. හිස් පෙට්ටි (වැසුම්) පෙට්ටි 1 යි.
67. උපකරණ පෙට්ටි 1 යි.
68. තේ සැම්පල් කාටුන් 1 යි.
69. සීස්ට් කාටුන් 2 යි.
70. විදුලි උපකරණ කාටුන් 1 යි.
71. ලන්තෑරුම් කාටුන් 1 යි.
72. එම්බ්‍රොයිඩරි නූල් කාටුන් 1 යි.
73. එම්බ්‍රොයිඩරි නූල් කාටුන් 8 යි.

10–100—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ✓ රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඩෙල්fප්ට් තටාක ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1970 ඔක්තෝබර මස 11 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 ඔක්තෝබර මස 10 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය: ඒඩී/විකිණීම්/35.
1970 සැප්තැම්බර මස 24 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ඇඹරුම් ගල් පෙට්ටි 1 යි.
2. කතුරු පෙට්ටි 1 යි.
3. උපකරණ පෙට්ටි 1 යි.
4. ඉලෙක්ට්‍රික් චෝක් කාටුන් 3 යි.
5. ෆ්ලොරසන්ට් ටියුබ් කාටුන් 1 යි.
6. කිරි පොවන බෝතල් පෙට්ටි 1 යි.
7. උපකරණ පෙට්ටි 1 යි.
8. ලන්තෑරුම් පෙට්ටි 1 යි.
9. හිස් බෝතල් පෙට්ටි 3 යි.
10. පාවිච්චි කළ ඇඳුම් පෙට්ටි 4 යි.
11. යන්ත්‍ර අමතර කොටස් පෙට්ටි 1 යි.
12. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
13. උදළු පෙට්ටි 1 යි.
14. ලාම්පු පෙට්ටි 1 යි.
15. වීදුරු ලාම්පු පෙට්ටි 1 යි.
16. නල මූඩි කාටුන් 1 යි.
17. ගොඩනැගිලි සවිකිරීමේ උපකරණ පෙට්ටි 1 යි.
18. අමතර කොටස් පෙට්ටි 2 යි.
19. අමතර කොටස් මලු 1 යි.
20. ටොයිලට් පේපර් කාටුන් 2 යි.
21. මිල්ටන් කාටුන් 1 යි.
22. පොත් පෙට්ටි 1 යි.
23. වීදුරු බඩු පෙට්ටි 1 යි.
24. සිරීමට ගන්නා කඩදාසි මිටි 1 යි.
25. හිස් බෝතල් පෙට්ටි 1 යි.
26. ඊයම් කෑලි 1 යි.
27. තඹලේරු කාටුන් 1 යි.
28. වැලි කඩදාසි මලු 1 යි.
29. ජැක් 1 යි.
30. ආමචර් මලු 1 යි.
31. විදුලි ඉස්තිරික්ක කාටුන් 9 යි.
32. ඇන සහ ඉස්කුරුප්පු මලු 3 යි.
33. පොරෝන 4 යි.
34. හිස් බෝතල් මලු 1 යි.
35. වීදුරු බඩු කාටුන් 1 යි.
36. ඩිසයින් පොත් පෙට්ටි 1 යි.
37. හිස් බෝතල් මලු 3 යි.
38. ප්ලාස්ටික් පෙට්ටි කාටුන් 1 යි.
39. ස්පොන්ජ් කාටුන් 2 යි.
40. තීන්ත පෙට්ටි 1 යි.
41. විදුලි උපකරණ කාටුන් 3 යි.
42. ටොයිලට් පෙ පර් මලු 1 යි.
43. අමතර කොටස් පෙට්ටි 1 යි.
44. දියසායම් මලු 1 යි.
45. බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
46. ගැරුප්පු පෙට්ටි 2 යි.
47. බයිසිකල් කොටස් මලු 1 යි.
48. fෙල්ට් සෙවිලි රෙදි රෝල් 4 යි.
49. නූල් කාටුන් 1 යි.
50. විදුලි උපකරණ කාටුන් 20 යි.
51. බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
52. බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
53. ෆ්ලොරසන්ට් ටියුබ් කාටුන් 4 යි.
54. හිසේ ගල්වන තෙල් පෙට්ටි 1 යි.
55. කොයිල් තඹ කාටුන් 1 යි.
56. ආයුධ සැට් කාටුන් 1 යි.
57. ප්‍රචාරක ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
58. සෞඛ්‍ය ආරක්ෂක භාණ්ඩ ක්‍රේට් 1 යි.
59. බෙහෙත් පෙති පෙට්ටි 1 යි.
60. ගල්ලෑලි මිටි 3 යි.
61. කිරිපොවන බෝතල් මලු 1 යි.
62. මෝටර් රථ කොටස් මලු 1 යි.
63. ටින් තහඩු කාටුන් 1 යි.
64. වීදුරු තඹලේරු කාටුන් 2 යි.
65. යන්ත්‍ර අමතර කොටස් පෙට්ටි 1 යි.
66. අල්පෙනෙත්ති (මළ බැඳුන)
67. සිරප් පෙට්ටි 1 යි.
68. ඇන සහ ඉස්කුරුප්පු මලු 1 යි.
69. ඉන්ගට්ස් කෑලි 22 යි.
70. මූඩි මිටි 1 යි.
71. රෙදි මිටි 1 යි.
72. සීස්ට් කාටුන් 1 යි.
73. මෝටර් රථ අමතර කොටස් පෙට්ටි 1 යි.
74. පොම්ප කොටස් පෙට්ටි 1 යි.
75. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
76. වැසිකිළි පිරිසිදු කිරීමේ කුඩු.
77. නිල් කාටුන් 1 යි.
78. බැටරි තහඩු පෙට්ටි 1 යි.
79. ලොකු කිරීමේ උපකරණ
80. කුඩාරම් උපකරණ මලු 1 යි.
81. පාවිච්චි කළ ඇඳුම් තොග 1 යි.
82. හිස් රෙදි උර (කපු) කාටුන් 2 යි.
83. පොත් (කුඩා ශබ්දකෝෂ) මලු 1 යි.
84. කෝදු (අඩි භාගය) මලු 1 යි.
85. ඩයි පෙට්ටි 1 යි.
86. පාවිච්චි කළ ඇඳුම් පෙට්ටි 1 යි.

10–101—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## මෝස්තර හා ආකෘති මිලයට ගැනීම

ගෘහ කර්මාන්ත හා වෙනත් කුඩා කර්මාන්තවලට යොදා ගැනීම සඳහා මෝස්තර හා ආකෘති මිලයට ගැනීමට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. මේ මඟින් දේශීය කර්මාන්ත වලට අළුත් මුහුණුවරක් දීමටත්, මෙරට කලාකරුවන් උනන්දු කර වීමටත් බලාපොරොත්තු වනු ලැබේ.

**(1) මෝස්තර අවශ්‍ය කර්මාන්ත**

(i) මුද්‍රිත රෙදි
(ii) අත් යන්ත්‍ර රෙදි.

**(2) ආකෘති අවශ්‍ය කර්මාන්ත**

(i) මැටි
(ii) පෙට්ටි—මළු
(iii) දැවමය හා කාර්මික කෙළි බඩු, බෝනික්කන්
(iv) කොහු භාණ්ඩ
(v) වේවැල්
(vi) සමරු
(vii) වෙනත් කලාත්මක භාණ්ඩ.

මේ යටතේ ඉදිරිපත් කරන ආකෘති, නිෂ්පාදනය කළ යුතු ප්‍රමාණයෙන් ම සාදා එවිය යුතුය.

**කොන්දේසි**

(i) ඉදිරිපත් කරන නිෂ්පාදන සම්පූර්ණයෙන් ම, ස්වතන්ත්‍ර ඒවා විය යුතුය.
(ii) තෝරා ගත් මෝස්තරයක්/ආකෘතියක් නිසා පැන නැගෙන ඇවුරුණු අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ සෑම ප්‍රශ්නයකටම, එය ඉදිරිපත් කරන්නා වග කිව යුතුය.
(iii) නොකඩවාම කලාකරුවන් ඉදිරිපත් කරන ආකෘති හා මෝස්තර පිළිගන්නා අතර, සෑම මසකටම වරක් විනිශ්චය මණ්ඩලයක් මඟින් සුදුසු දෑ තෝරා ගන්නවා ඇත.
(iv) තේරීම් පිළිබඳ මගේ නිගමනය අවසාන තීරණය වශයෙන් පිළිගත යුතුය.
(v) එක් මෝස්තරයකට/ආකෘතියකට විනිශ්චය මණ්ඩලයේ නිර්දේශවලට අනුකූලව රු. 50 සිට රු. 250 දක්වා මුදලක් ගෙවනු ලැබේ.
(vi) ඒ ඒ මාසයේ තෝරුණු ලැයිස්තුව ප්‍රවෘත්ති පත්‍රවල ප්‍රසිද්ධ කිරීමෙන් මසකට පසු නොතෝරුණු මෝස්තර/ආකෘති ඉවත දමනු ලැබේ.
(vii) ඉදිරිපත් කරන මෝස්තර හා ආකෘතිවල ආරක්ෂාවට දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.
(viii) විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව, මිළ දී ගන්නා සෑම භාණ්ඩයකට සම්පූර්ණ අයිතිය මට පැවරෙයි.
(ix) මෝස්තර ඇඳීමට පෙර මෙම දෙපාර්තමේන්තුවේ මෝස්තර අංශයට අවුත් අවශ්‍ය දිග, පළල දැනගත යුතුය.
(x) මෝස්තර/ආකෘති සැපයීම සම්බන්ධව අවශ්‍ය සියලුම විස්තර මෝස්තර අංශයෙන් ලබාගත හැක.
(xi) විනිශ්චය සඳහා ඉදිරිපත් කරන මෝස්තරය පෞද්ගලිකව හෝ ලියාපදිංචි කළ තැපැල් මඟින් හෝ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ආපසු ලබා ගැනීමට බලාපොරොත්තු වන මෝස්තර, තමන්ගේ ලිපිනය ලිවූ කවරයක් ද සමග එවිය යුතුය.
(xii) ආකෘති මෝස්තර අංශයට ගෙනවුත් භාර දිය යුතුය. ආකෘති ආපසු ලබා ගැනීමට අවශ්‍ය නම් ප්‍රතිඵල නිකුත් වී මසක් ඇතුළත ඉවත් කරගෙන යා යුතුය.
(xiii) ආකෘති සෑදීමට ගන්නා අමු ද්‍රව්‍ය හැකි තරම් මෙරටින්ම ලබා ගත හැකි විය යුතුය.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 19 දින,
කොළඹ 1, ජේමාස් ගොඩනැගිල්ලේ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

10–95—70.10.2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### රත්මලාන මහල් නිවාස ක්‍රමය

ඉහත සඳහන් මහල් නිවාස ක්‍රමයේ නිවාස පැවරීම සලකා බැලීම සඳහා මෙම නිවාස ලබා ගැනීමට බලාපොරොත්තු වන්නන්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

2. සුදුසුකම් පිළිබඳ කොන්දේසි පහත සඳහන් පරිදිය :—

(අ) අයදුම්කරු ලාංකිකයෙකු විය යුතුය.

(ආ) මාසික කුලී පදනම මත පවරන නිවාස සඳහා පවුලේ සම්පූර්ණ මාසික ආදායම රු. 300 ට නොඅඩු හා රු. 850 ට නොවැඩි විය යුතු අතර, කුලියට සින්නවීමේ පදනම මත පවරන නිවාස සඳහා පවුලේ සම්පූර්ණ මාසික ආදායම රු. 450 ට නොඅඩු හා රු. 950 ට නොවැඩි විය යුතුය.

(ඇ) අයදුම්කරු/අයදුම්කාරිය විවාහකයෙකු විය යුතු අතර, යටත් පිරිසෙයින් තමන්ගෙන් යැපෙන්නන් එක් අයකුවත් සිටිය යුතුය.

(ඈ) අයදුම්කරු/අයදුම්කාරිය හෝ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ යැපෙන දරුවකු හෝ සතු පදිංචියට සුදුසු නිවාසයක් දිවයිනේ කිසිම ප්‍රදේශයක නොතිබිය යුතුය.

(ඉ) අයදුම්කරු/අයදුම්කාරිය හෝ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ නිවාස ක්‍රමයේ සිට සැතපුම් 10ක අර්ධ විෂ්කම්භයක් තුළ පදිංචි හෝ සේවයෙහි නියුක්ත හෝ වෘත්තියක නියුක්ත හෝ වූවකු විය යුතුය.

(ඊ) අයදුම්කරු/අයදුම්කාරිය හෝ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ දැනටමත් මෙම දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයකින් හෝ කුලියට සින්නවීමේ නිවාසයක් ලබා නොසිටිය යුතුය.

3. පහත සඳහන් කරුණු ගැන අයදුම්කරුගේ අවධානය, යොමු විය යුතුය ;—

(අ) මහල් නිවාසයක කුලිය සාමාන්‍ය වශයෙන් පහත සඳහන් පරිදි වේ.

| | කුලියට පමණක් දෙනු ලබන නිවාස සඳහා | | කුලියට සින්නවීමේ ක්‍රමයට පවරන නිවාස සඳහා (අවු. 25කට) |
|---|---|---|---|
| බිම් මහල (මසකට) | රු. 110 | ... | රු. 175 |
| පළමු මහල (මසකට) | රු. 95 | ... | රු. 155 |
| දෙවන මහල (මසකට) | රු. 80 | ... | රු. 125 |
| තෙවන මහල (මසකට) | රු. 75 | ... | රු. 120 |

(ආ) එක් මහල් නිවාසයක් කාමර දෙකකින් ද, සාලයකින් ද සමන්විත වන අතර, නිවසේ මුළු ඉඩ ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් වර්ග අඩි 400ක් පමණ වේ.

(ඇ) කුලියට සින්නවීමේ ක්‍රමයට නිවාස පවරා දීමට තෝරාගත් අයදුම්කරුවන්ට පසුව බලපැවැත්වෙන කොන්දේසි මත එම නිවාස අයිතිකර දීම සඳහා කටයුතු කරනු ඇත.

(ඈ) නිවාසවල ගැනුම් මිලෙන් සෑහෙන කොටසක් අත්තිකාරම් වශයෙන් තැන්පත් කිරීමට කැමති අයට මෙම මහල් නිවාස පවරා දීමේදී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. කුලියට සින්නවීමේ ක්‍රමයට නිවාස ලබාගන්නා බදුකරුවන්ගෙන් යටත් පිරිසෙයින් රු. 1,500ක අත්තිකාරම් තැන්පත් මුදලක් බලාපොරොත්තු වේ. එම අත්තිකාරම් මුදල නිවසේ ගැනුම් මිලෙන් අඩුකරනු ලැබේ. මාසික කුලී බදු ක්‍රමයට නිවාස ලබා ගන්නා අයට අත්තිකාරම් වශයෙන් තුන් මාසයක කුලිය තැන්පත් කිරීමට සිදුවනු ඇත. මෙම මහල් නිවාස ලබා ගන්නට බලාපොරොත්තු වන්නේ **මාසික කුලියට පමණක්ද, එසේ නැතහොත් කුලියට සින්නවීමේ ක්‍රමයටද යන වග පැහැදිලිව සඳහන් කළ යුතුය.**

(ඉ) කුලියට සින්නවීමේ ක්‍රමයට හෝ මාසික කුලී පදනම මත නිවාස පැවරීමේදී නියමිත මහල් වෙන් කිරීමේදීත්, අයදුම්කරුවන්ගේ මාසික ආදායම් තත්ත්වය සැලකිල්ලට යොමු වන බව සිතතබා ගත යුතුය.

එනම්, මහල් නිවාසයක මාසික කුලිය/මාසික වාරිකය මෙන් හතර ගුණයකට නොඅඩු ආදායමක් අයදුම්කරු ලැබිය යුතුය. මෙම නිවාස සහ ඒ ඒ මහල් වෙන් කිරීම ජාතික නිවාස කොමසාරිස්තැනගේ අභිමතය පරිදි සිදුවේ. අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව ගැන සලකා බලා ඒ ඒ මහල් නිවාස පන්ති කුලියට හෝ කුලියට සින්නවීමේ ක්‍රමයට හෝ දෙනවාද යන්න ගැන තීරණය කිරීමේ සම්පූර්ණ අයිතිය ජාතික නිවාස කොමසාරිස්තැන සතුවේ.

4. අයදුම්පත්, කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් මිළදී ගතහැකි ආකෘති පත්‍රයේ විය යුතු අතර, සම්පූර්ණ කළ අයදුම්පත් ''ජාතික නිවාස කොමසාරිස්'' වෙත 1970 ඔක්තෝබර් මස 18වැනි ඉරු දින පස්වරු 4.30ට පෙර ලැබෙනසේ **ලේඛණගත තැපෑලෙන්** එවිය යුතුය. අයදුම් පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ ''රත්මලාන මහල් නිවාස ක්‍රමය සඳහා අයදුම්පත්'' යනුවෙන් සඳහන් කළ යුතුය.

5. මෙම නිවාස සඳහා දැනටමත් රු. 1,000 ක් හෝ ඊට වැඩි මුදලක් තැන්පත් කර ඇති අයදුම්කරුවන් විසින් නැවත ඉල්ලුම් කිරීම අනවශ්‍යය. 1969.3.29 දිනැති නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කර ඇති නමුත් සුදුස්සන් වශයෙන් තෝරා ගෙන නොමැති හා තෝරා ගෙන ඇති නමුත් මුදල් තැන්පත් කර නොමැති අයදුම්කරුවන් මෙම නිවාස ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් අලුතින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
වැඩ බලන ජාතික නිවාස කොමසාරිස්.

1970 සැප්තැම්බර් මස 24 දින,
කොළඹ 2,
ජාතික නිවාස දෙපාර්තමේන්තුවේදීය.

10–105—70.10 2 දින අංක 14,926 දරන ගැසට් පත්‍රය

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)**

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. පෝය දිනවලට පෙර දින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම් පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අහලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අහලේ සෑම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | | | | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොටසක් | ... | ... | ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ--වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | | | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|---|---|---|
| | | ශ | | රු. | | රු. ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් | ... | ... | ... | 0 50 | ... | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | ... | ... | ... | I 0 | .. | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 30 | ... | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.